
වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2023
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2023

වැය ශීර්ෂ අංකය- 304

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

2023 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය- 304

අන්තර්ගතය

1. පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1. හැඳින්වීම 3
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 6
1.3. ප්‍රධාන කාර්යයන් 7
1.4. සංවිධාන ව්‍යුහය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 9
1.4.1. විධායක හා ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු වලට අදාල සංවිධාන ව්‍යුහය 10
1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල 11
1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 11
1.5.2. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල 13
1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 13
1.7. විදේශ අධාර ලබන ව්‍යාපෘති සහ ණය යොජණා ක්‍රම යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 14
2. පරිච්ඡේදය 16

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 16

2.1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය 18
2.1.1. ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය (අනාවැකිකරණ අංශය) 18
2.1.2. පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය 19
2.1.3. නිරීක්ෂණ ජාල සහ ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල 20
2.1.4. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය 21
2.1.5. සංඛ්‍යානමය අනාවැකි අංශය (NWP) 21
2.1.6. ඉලෙක්ට්‍රොනික අංශය 22
2.1.7. උපකරණ අංශය 24
2.1.8. දත්ත සැකසුම් හා සංරක්ෂණ අංශය 24
2.1.9. වර්ෂාපතන, දත්ත, දේශගුණ අංශ 27
2.1.10. කෘෂි කාලගුණ විද්‍යා අංශය 27
2.2. අභියෝග 27
2.3. ඉදිරි ඉලක්ක 28
3. පරිච්ඡේදය 31

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 31

3.1 මූල්‍ය ප්‍රකාශන 33
3.1.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 33
3.1.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 34
3.1.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 35
3.1.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 36
3.2. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 37
3.3. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 37
3.4. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 38
3.5. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 38
3.6. විගණකාධිපතිවරයාගේ වාර්තාව 39
4. පරිච්ඡේදය 41

කාර්යසාධන දර්ශක 41

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 43

5. පරිච්ඡේදය 45
තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය 45
5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 47
5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් 50
5.2.1. තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය 50
5.2.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ අභියෝග 55
6. පරිච්ඡේදය 57
මානව සම්පත් පැතිකඩ 57
6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය (2023.12.31 දිනට කාර්ය මණ්ඩලය) 59
6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය 59
6.3. මානව සම්පත් සංවර්ධනය 60
7. පරිච්ඡේදය 67
අනුකූලතා වාර්තාව 67
7.1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනුකූලතා වාර්තාව 69

1. පරිච්ඡේදය

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

යටත්විජිත කාලයේ සිටම තේ, කෝපි ආදි වාණිජ වගාවන් සඳහා කාලගුණික දත්ත වල අවශ්‍යතාවය මතු විය. මේ අනුව 1860 වර්ෂයේදී වර්ෂාමාන ජාලයක් ස්ථාපිත කිරීම මෙම අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකාවට තැබූ මුල් පියවර ලෙස දැක්විය හැක. මුලින්ම මෙරට තුල විධිමත්ව කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම 1867 වසරේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ විය. පසුව 1909 දී කාලගුණ විද්‍යාත්මක කටයුතු සඳහා කොළඹ නිරීක්ෂණාගාරය නමින් වෙනම අංශයක් වර්තමාන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පිහිටුවීම සිදු විය. විද්‍යාව දියුණු වීමත් සමග සන්නිවේදන සහ ප්‍රවාහන ක්‍රම හරහා ගෝලීය සම්බන්ධතා වර්ධනය වනවිට වෙනත් රටවල් සහ ශ්‍රී ලංකාව අතර ගුවන් ගමන් සිදුවීමත් සමග තවත් කඩ ඉමක් සනිටුහන් කරමින් 1946 වසරේදී ගුවන් යානා සඳහා අවශ්‍ය කාලගුණික තොරතුරු සපයමින් ගුවන් කාලගුණික කටයුතු ආරම්භ විය. කාලගුණික තොරතුරු වඩා ක්‍රමවත් ලබාගැනීම, ඒවා විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය ප්‍රජාව වෙත ලබා දීම ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකා වඩාත් ගුණාත්මක සේවයක් සැපයීමට 1948 දී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. සිය කාර්යභාරය තවදුරටත් පුළුල් කරමින් ජාත්‍යන්තරය සමග නීත්‍යානුකූලව හා වගකීම් සහගතව සම්බන්ධ වෙමින් 1951 වසරේදී ලෝක කාලගුණ සංගමයේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.

සෞභාග්‍යමත් කෘෂි ආර්ථිකයකට ඇති උරුමය වඩාත් ශක්තිමත් කරමින්, විවිධ ප්‍රධාන මෙන්ම සුලු අපනයන බෝග වගාවට මෙන්ම අනෙකුත් සියලු කෘෂි කාර්මික කටයුතු වල යෙදෙන ශ්‍රී ලාංකේය ජනතාව බලගන්වමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂි කාලගුණ විද්‍යා අංශයක් ස්ථාපනය කරන ලදී.

අභ්‍යන්තර හා ජාත්‍යන්තර නාවික කටයුතු සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාවැකි සපයන අතර (Ship Report, Fleet Forecast..etc) මුහුදු වෙරළ ආශ්‍රිතව ජීවත්වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය හා විදේශ විනිමය උපයන ප්‍රමුඛ මාර්ගයක් වන ධීවර කටයුතු සඳහා (එක්දින හා බහුදින ධීවර යාත්‍රා සඳහා) අවශ්‍ය කාලගුණික දත්ත, අනතුරු ඇගවීම් හා අනාවැකි ලබා දෙන අතරම දුරකතන ජාල පහසුකම් සපයන ආයත්නයක් සමග පසුගිය වසර වලදී (2022 සහ 2023) ධීවර ජනතාවට කාලගුණික තොරතුරු සැපයීම සඳහා ඉතා සාර්ථකව වැඩසටහනක් (“සයුර” ධීවර වැඩසටහන) ආරම්භ කරන ලදි. එසේම ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා ප්‍රමිතීන්ට අනුකූලව අභ්‍යන්තර සහ ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා කටුනායක, මත්තල, රත්මලාන සහ පලාලි ගුවන් තොටුපලවල් මූලික කරගනිමින් ගුවන් ගමන් සඳහා කාලගුණික දත්ත, අනාවැකි සහ අනතුරු ඇඟවීම් ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් පසුව ඉන්දියානු සාගර කලාපයට බලපාන සුනාමි තත්ත්ව වලදී ජාත්‍යන්තර සංවිධාන සමග සහසම්බන්ධ වෙමින් ජනතාව දැනුම්වත් කිරීම, නිවේදන සහ අනතුරු ඇඟවීම් නිකුත් කිරීම ද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී ඇති තවත් ජාතික වගකීමකි.

අද ලෝකය මුහුණ දෙන ප්‍රබලම ගැටලුව වන දේශගුණික විපර්යාස පිලිබඳ අධ්‍යයනය කිරීම සඳහා දේශගුණික විපර්යාස අධ්‍යයන අංශය ක්‍රියා කරන විට සහ කෙටි කාලීනව සහ දීර්ඝ කාලීනව සිදුවූ වෙනස්වීම් මෙන්ම ඉදිරියේ දී සිදුවිය හැකි වෙනස්වීම් අධ්‍යයනය පිලිබඳ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහ සංවර්ධන අංශය කටයුතු කරයි.

මාධ්‍ය මගින් ලබාදෙන කාලගුණික අනාවැකි සහ අනතුරු ඇඟවීම් නිවැරදිව අවබෝධ කරගැනීමට මෙන්ම කාලගුණික ආපදා වලින් ආරක්ෂා වන අකාරය පිලිබඳව දෙපාර්තමේන්තුව මගින් සෘජුවම දැනුම්වත් කිරීමේ වැඩසටහන් සිදුකරන අතර වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන මගින් සිදු කරන වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම ද අපගේ ප්‍රමුඛ කාර්යයක් ලෙස දැක්විය හැක.

කෘෂිකාර්මික කටයුතු, බලශක්ති (ජල විදුලිය) කටයුතු සඳහා කාලගුණික දත්ත හා අනාවැකි සැපයීම මගින් එම කටයුතු සාර්ථකව කර ගැනීමට සහය ලබා දෙන අතරම කාලගුණික ආපදා හේතුවෙන් වන්දි ලබා දීමේදී රක්ෂණ ආයතන හෝ අදාළ නීතිමය ආයතන කටයුතු සඳහා පැවති කාලගුණික තත්ත්ව පිළිබඳ විස්තර වාර්තා ලබා දීමද සිදු කරයි. විශ්ව විද්‍යාල සිසුන්ගේ උපාධි සහ පශ්චාත් උපාධි පර්යේෂණ සඳහා කාලගුණික දත්ත සහ උපදෙස් ලබාදීමට අමතරව අධීක්ෂන කටයුතු ද අප විසින් සිදු කරයි.

එදිනෙදා කාලගුණික අනාවැකි සහ අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු කරුණු දෙපාර්තමේන්තුවේ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය යටතේ පවතින අතර කෘෂිකාර්මික සහ බලශක්ති (ජල විදුලිය) කටයුතු වලදී වැදගත් වන මධ්‍ය කාලීන සහ දිගු කාලීන කාලගුණික අනාවැකි දේශගුණික විපර්යාස සහ පර්යේෂණ අංශ මගින් සිදුකරයි. මීට අමතරව පරිගණක, දත්ත සැපයුම්, ගණිතමය කාලගුණික අනාවැකි (NWP), සාගර කාලගුණික අනාවැකි, වර්ෂාපතන දත්ත, රේඩාර් තාක්ෂණික, ඉලෙක්ට්‍රොනික කටයුතු, නඩත්තු කටයුතු, පරිපාලනමය සහ ගිනුම් කටයුතු සඳහා වෙන වෙනම අංශ සහිතව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකාවේ බලපාන ස්වභාවික ආපදා සියල්ලටම පාහේ කාලගුණ සාධක වලට සෘජුවම සම්බන්ධ බැවින් ඒ හා සම්බන්ධ වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය හා ආපදා කලමණාකරන මධ්‍යස්ථානය වැනි රාජ්‍ය ආයතන සමග මෙන්ම වගකිවයුතු රාජ්‍ය නොවන සංවිධාන සමගද එක්ව ජාතික අවශ්‍යතාවයන් සහ අන්තර් ජාතික ප්‍රමිතීන් සපුරාලමින් කාලගුණය සහ දේශගුණය පිළිබඳව මහජනතාව වෙත සේවය සපයන විශිශ්ටතම කේන්ද්‍රස්ථානය වීම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දැක්ම වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"නිරසර ලෙස සංවර්ධිත ශ්‍රී ලංකාවක් උදෙසා කාලගුණය සහ දේශගුණය පිළිබඳ සේවාවන් සපයන ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම බුද්ධි මධ්‍යස්ථානය වශයෙන් පැවතීම"

මෙහෙවර

ජාතික ශුභ සිද්ධියට සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වෙමින්
රාජ්‍ය ආයතන වලට, පෞද්ගලික අංශයේ ආයතන වලට සහ මහජනයාට කාලගුණ විද්‍යාව,
ගුවන් කාලගුණ විද්‍යාව, සමුද්‍ර කාලගුණ විද්‍යාව, ජල කාලගුණ විද්‍යාව, කෘෂි කාලගුණ විද්‍යාව,
දේශගුණ විද්‍යාව සහ සීමිත වූ තාරකා විද්‍යාව පිළිබඳ සේවාවන් සැපයීම.

අරමුණු


- විවිධ ක්ෂේත්‍ර වලට අදාළව සිදුවන බලපෑම පාදක කරගත් ස්ථානය හා වේලාව වඩා නිරවද්‍ය වූ කාලගුණ අනාවැකි සේම කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම.
- ඍතු අනාවැකිකරණය විශේෂයෙන්ම කෘෂිකර්මාන්තයට අදාළ වන සේ නිකුත් කර එම අනාවැකි නිතිපතා යාවත්කාලීන කිරීම.
- රජයේ දිගුකාලීන සංවර්ධන කටයුතු පහසුකර ගැනීම සඳහා එම සංවර්ධන කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීමට අවශ්‍ය දේශගුණික අනාවැකි වඩා විශ්වාසනීය තත්ත්වයකට ගෙන ඒම.
- දෙපාර්තමේන්තුවේ සියලු යටිතල පහසුකම් අන්තර්ජාතික තත්ත්වයට ගැලපෙන පරිදි නවීකරණය කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- මහජනතාවගේ ජීවිත ආරක්ෂාව, දේපළ ආරක්ෂා කිරීම සහ යහපැවැත්ම සහතික කිරීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන කාල පරාසයන් පිළිබඳ කාලගුණික සහ දේශගුණික තොරතුරු ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) විසින් නියම කර ඇති තාක්ෂණික රෙගුලාසි සහ ජාතික අවශ්‍යතා අනුව සැපයීම.
- මහජනතාවගේ ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන අධික වැසි, නිවර්තන සුළි සුළං, අකුණු සහ ගිගුරුම් සහිත වැසි, තද සුළං, අධික උෂ්ණත්වය (උණුසුම් කාලගුණය) වැනි කාලගුණය ආශ්‍රිත සිදුවීම් සඳහා අනතුරු ඇඟවීම් සහ උපදේශන සැපයීම.
- ගුවන් මගීන්ගේ මෙන්ම ගුවන් යානවල ආරක්ෂාව සඳහා ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (World Meteorological Organization-WMO)සහ අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානයේ (International Civil Aviation Organization-ICAO) සියලු ප්‍රමිතින්ට අනුකූලව ගගණ කටයුතු සඳහා කාලගුණ තොරතුරු සේවා සැපයීම.
- සමුද්‍ර කාලගුණ විද්‍යා සේවාවන්ට අදාලව මහ මුහුදේ ජාත්‍යන්තර නාවික, මසුන් ඇල්ලීම සහ අනෙකුත් සාගර කටයුතු සඳහා සහ වෙරළබඩ සහ අක්වෙරළ ප්‍රදේශ, වරායන් සහ වෙරළ තීරයේ සිදුවන විවිධ සමුද්‍ර ක්‍රියාකාරකම් සඳහා සමුද්‍ර කාලගුණ විද්‍යා සේවා සැපයීම.
- ලෝක කාලගුණ විද්‍යා සංවිධානය (WMO) විසින් නියම කර ඇති තාක්ෂණික රෙගුලාසි සහ ජාතික අවශ්‍යතා අනුව ආපදා කළමනාකරණ අධිකාරිය (DMC) සහ අනෙකුත් ජාතික අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථාන වෙත තත්‍ය කාලීන කාලගුණ නිරීක්ෂණ දත්ත හා වර්ෂාපතන තීව්‍රතා අනාවැකි වැනි ජල-විද්‍යා සේවා සැපයීම.
- අයහපත් කාලගුණයෙන් සහ දේශගුණයෙන් කෘෂිකර්මාන්තයට ඇති වන බලපෑම අවම කිරීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා කාලගුණ සහ දේශගුණික තොරතුරු සහ අනාවැකි සැපයීම.
- ජාතික අවශ්‍යතා අනුව ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) ප්‍රමිතින්ට අනුකූලව ශ්‍රී ලංකාව සඳහා දේශගුණ විද්‍යා සේවා සැපයීම. (ශ්‍රී ලංකාවේ දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) කේන්ද්‍රස්ථානයක් ලෙස, DoM විසින් ශ්‍රී ලංකාව සඳහා දේශගුණික විපර්යාස තොරතුරු, දත්ත සහ දේශගුණික ප්‍රක්ෂේපණයන් සපයයි.)
- කාලගුණ විද්‍යාත්මක සහ ඒ ආශ්‍රිත නිරීක්ෂණ එකතු කිරීම, දේශගුණික දත්ත සමුදා කළමනාකරණය සහ ජාතික සංවර්ධන සහ පර්යේෂණ අරමුණු සඳහා කාලගුණ විද්‍යා සහ දේශගුණ විද්‍යා සේවා සහ දත්ත සැපයීම.

- ජාත්‍යන්තර නියෝජිතායතනවලට සම්බන්ධකම් ඇති කර ගැනීම.
- පසුබිම් පත්‍රිකා සකස් කිරීම සහ නියෝජනය මගින් දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර උපදේශන සඳහා රජයට සහාය වීම.
- සීමිත තාරකා විද්‍යාත්මක ආශ්‍රිත සේවා සැපයීම (හිරු, සඳ, ග්‍රහලෝක සහ උදම්).
- ජාතික සුනාමි අනතුරු ඇඟවීම සඳහා සුනාමි සේවා සපයන්නන්ගේ (TSPs) තොරතුරු ලබා ගෙන සෘජුවම, භූමිකම්පා සහ සුනාමි තොරතුරු ලබා ගැනීම, ලැබී ඇති සියලුම තොරතුරු විශ්ලේෂණය කර රටට ඇති සුනාමි තර්ජනය තක්සේරු කිරීම, කාලෝචිත සුනාමි අනතුරු ඇඟවීම් හෝ අවලංගු කිරීම් නිකුත් කිරීම.
- කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව, දේශගුණික විපර්යාස සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයනය සහ පර්යේෂණ දිරිමත් කිරීම.
- කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස තේමා ක්ෂේත්‍ර පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ දායක වීම.
- පාසල් ළමුන්, ප්‍රතිපත්ති සහ තීරණ ගන්නන් ඇතුළු උනන්දුවක් දක්වන කණ්ඩායම් සඳහා අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් සහ වැඩමුළු, අනිවාර්ය තේමා ක්ෂේත්‍ර පිළිබඳව සංවිධානය කිරීම සහ දායක වීම.
- ප්‍රදර්ශන භාණ්ඩ සහ සම්පත් පිරිස් සමඟ ප්‍රදර්ශන සඳහා දායක වීම.
- ඉල්ලීම මත විශේෂිත කාලගුණ විද්‍යා සහ දේශගුණික සේවා සැපයීම.


1.4. සංවිධාන ව්‍යුහය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව



1.4.1. විධායක හා ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු වලට අදාල සංවිධාන ව්‍යුහය

ඇමුණුම 02

කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව - විධායක හා ජ්‍යෙෂ්ඨ විධායක තනතුරු වලට අදාල සංවිධාන ව්‍යුහය



කෙටි යෙදුම් හා විස්තර සඳහා අනිත් පිට බලන්න

<u>කෙටි යෙදුම් හා විස්තර</u>

අධ්‍යක්ෂ ජනරාල්

අතිරේක කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ 1 - නිරීක්ෂණ ජාල, උපකරණ හා බාහිර කාර්යාල

අධ්‍යක්ෂ 2 - අනාවකිකරණ, තීරණ උපකාරක හා ගුවන්තොටුපල සේවා

අධ්‍යක්ෂ 3 - පර්යේෂණ, දේශගුණ විපර්යාස අධ්‍යනය,පුහුණු හා දැනුවත් කිරීම්, ව්‍යාපෘති හා සැලසුම්

අධ්‍යක්ෂ 4 - දත්ත සැකසුම් හා සංරක්ෂණය, දේශගුණ දත්ත, කෘෂි විද්‍යා කටයුතු හා පරිගණක අංශයේ කටයුතු

නි.අ. - නියෝජ්‍ය අධ්‍යක්ෂ (තනතුරු 07)

කා.වී. - කාලගුණ විද්‍යාඥ / ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යාඥ

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල


1.5.1. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

අංශය	වගකීම් ක්ෂේත්‍රයන්
දත්ත සැකසුම් හා සංරක්ෂණ අංශය	• කාලගුණ විද්‍යා දත්ත සැකසීම, සංරක්ෂණය, දත්ත පද්ධති පවත්වාගෙන සිතියම් ගත කිරීම සහ නිකුත් කිරීම ඇතුළු දත්ත සැකසුම් හා සංරක්ෂණ රාජකාරි. • දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය සැලසුම්කරණය, යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම • දත්ත නිකුත් කිරීම සඳහා වන විද්‍යුත් තැපෑල පවත්වාගෙන යාම
කෘෂි කාලගුණ අංශය	• කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශය සතිපතා සැකසීම • කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ බාහිර කාර්යාල වලින් සහ වෙනත් පාර්ශව කරුවන් ගෙන් ලැබෙන දත්ත කළමනාකරණ නිසි පරිදි සිදු කිරීම • කෘෂි කාලගුණ මධ්‍යස්ථාන අධීක්ෂණය සිදු කිරීම
ලේඛනාගාරය	• දත්ත සංරක්ෂණය කිරීම
ව්‍යාපෘති හා සැලසුම් අංශය	• දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක සියලුම ව්‍යපෘති හා සම්බන්ධ ලිපිගොනු (Project files) ගබඩා කිරීම • JICA ව්‍යපෘති (ඩොප්ලර් කාලගුණ රේඩාර් ව්‍යපෘතිය - පුත්තලම සහ පොතුවිල් / දෙපාර්තමේන්තුවේ ධාරිතාව ගොඩනැගීමේ ව්‍යපෘතිය) • දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් සකස් කිරීම, යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීම.
සංඛ්‍යානමය අනාවැකි අංශය (NWP)	• ගෝලීය කාලගුණ ආකෘති සපයනු ලබන පුරෝකථන දත්ත ලබාගැනීම. • ගෝලීය දත්ත විශ්ලේෂණය සහ පුරෝකථන සකස් කිරීම. • දෙපාර්තමේන්තුවේ කාලගුණ ආකෘතිය ධාවනය හා පුරෝකථන සකස් කිරීම. • ආකෘති දත්ත ගබඩා කිරීම සහ වෙනත් පද්ධති සඳහා දත්ත සකස් කිරීම. • ආකෘති සත්‍යාපනය සහ පර්යේෂණ

අංශය	වගකීම් ක්ෂේත්‍රයන්
ඉලෙක්ට්‍රොනික අංශය	• මෙහෙයුම් හා නඩත්තු කටයුතු (O & M) • ස්වයංක්‍රිය කාලගුණ පද්ධති • ව්‍යාපෘති සඳහා සහය
උපකරණ අංශය	• සාම්ප්‍රදායික කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම, ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම, බාහිර පාර්ශ්වයන්ගේ ඉල්ලීම් මත කාලගුණ විද්‍යා උපකරණ ක්‍රමාංකනය කිරීම සහ නඩත්තු කිරීම සහ වඩු වැඩ සහ තාක්ෂණික කටයුතු සහ ප්‍රදර්ශන සඳහා සහාය වීම
අනාවකිකරණ සහ තීරණ උපකාරක අංශය (NMC)	• කාලගුණ දත්ත සැකසීම සහ විශ්ලේෂණය, කාලගුණ අනාවැකි සහ බෙදා හැරීම, ජාතික සුනාමි සහ කාලගුණ අනතුරු පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීම • කාලගුණ අනාවැකිය, බලපෑම් මත කාලගුණ අනාවැකිය, ආපදා කළමනාකරණය සහ අකුණු අධ්‍යයන මධ්‍යස්ථානය ජාත්‍යන්තර ආපදා ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ විමසුම් සඳහා සහයෝගිතාව
ගුවන්තොටුපල සේවා	• ගුවන් සේවා කාලගුණ විද්‍යාව සඳහා උපකාර කිරීම සඳහා ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO) සහ ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) රෙගුලාසිවලට අනුකූලව කාලගුණ විද්‍යාත්මක දත්ත/තොරතුරු සැපයීම
පර්යේෂණ අංශය	• කාලගුණ විද්‍යාත්මක හා දේශගුණ විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීම
දේශගුණ විපර්යාස අධ්‍යන අංශය	• දේශගුණික විපර්යාස සම්බන්ධ කටයුතු සිදු කිරීම
පුහුණු හා දැනුවත්	• දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම, දෙපාර්තමේන්තු හා කඩඉම් විභාග පැවැත්වීම. • දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන පාසැල් සිසුන් කාලගුණය සම්බන්ධ දැනුවත් කිරීම, වෙනත් ආයතන වලින් දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණෙන පුද්ගලයන්ට අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකිරීම, බාහිර පාර්ශවයන් විසින් කාලගුණය සම්බන්ධ දැනුවත් කිරීම් ඉල්ලා ඇති විටදී එම වැඩසටහන් සංවිධානය කිරීම, බාහිර පාර්ශවයන් විසින් කාලගුණය සම්බන්ධ දැනුවත් කිරීම් සංවිධානය කර ඇති විටදී ඒ සඳහා සුදුසු සම්පත් දායකයන් ලබාදීම.

අංශය	වගකීම් ක්ෂේත්‍රයන්
පාලන හා මූල්‍ය	• කාර්ය මණ්ඩලය සම්බන්ධ ආයතනික කටයුතු • මූල්‍ය කටයුතු • ප්‍රසම්පාදන, ගබඩා කිරීම්, බෙදාහැරීම් • වාහන නඩත්තුව හා ප්‍රවාහන කටයුතු • ගබඩා කිරීම සහ හැසිරවීම ද්‍රව්‍ය, කොටස් වාර්තා නඩත්තු කිරීම • සාමන්‍ය පරිපාලනය
අභ්‍යන්තර විගණන	• අභ්‍යන්තර විගණන සැලැස්ම, අභ්‍යන්තර විගණන සහ විගණන විමසුම්

1.5.2. දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල



කටුනායක, මත්තල, රත්මලාන, යාපනය, අනුරාධපුරය, බදුල්ල, බණ්ඩාරවෙල, මඩකලපුව, හම්බන්තොට, කටුගස්තොට, කුරුණෑගල, මහඉලුප්පල්ලම, මන්නාරම, මොණරාගල, නුවරඑළිය, පොළොන්නරුව, පොතුවිල්, පුත්තලම, රත්නපුර, ත්‍රිකුණාමලය, ගාල්ල, වවුනියාව,මුලතිව්.

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

මහ භාණ්ඩාගාරයේ ගිණුමෙන් ලැබෙන මුදලින් නඩත්තු වේ. අරමුදල් නොමැත.

1.7. විදේශ අධාර ලබන ව්‍යාපෘති සහ ණය යොජණා ක්‍රම යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම	දායක නියෝජි - කායතනය	ඇස්තමේන්තුගත මුළු පිරිවැය (TEC)	ව්‍යාපෘතියේ කාල සීමාව
විදේශ අධාර ලබන ව්‍යාපෘති			
ඩොප්ලර් රේඩාර් පද්ධතිය	JICA	ව්‍යාපෘතියට අදාළ ප්‍රදාන ගිවිසුමේ සංශෝධනය 2023-11-22 දින අත්සන් කරන ලද අතර, ප්‍රදාන මුදල JPY 2,663,000,000 ලෙස සංශෝධනය කර ඇත.	2023 - 2026 *2019 වසරේදී ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද නමුත් නොවලැක්විය හැකි හේතු නිසා ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම ප්‍රමාද වී ඇත.
දෙපාර්තමේන්තුවේ ධාරිතා ගොඩනැගීමේ ජයිකා ව්‍යාපෘතිය (JICA – Capacity Building Project)	JICA	විදේශ ප්‍රදානය- JPY 31.364 Mn 2023 -JPY 0.9 Mn (LKR 1.89 Mn) දේශීය ප්‍රදානය- Rs.3 Mn (requested but not received)	2023 - 2026 දෙසැම්බර්
CSP-2023-27 Plan facilitate for the training programs on seasonal forecasting and Agro-met trainings (India-IMD) CRIWMP (this project is belonging to the ministry of Mahaweli and Irrigation)	UNDP	රු. මිලියන 4.63	2023
provided IT equipment	WFP	රු. මිලියන 2.35	2023
facilitate for conducting two awareness raising of school teachers in Colombo and Gampaha districts on climate change impacts	WFP	රු. මිලියන 1.15	2023
WFP- Adaptation provided IT equipment (9 Laptops and 3 printers)	WFP	Not informed yet	2023
ණය යෝජණා ක්‍රම යටතේ			
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය	World Bank Loan	ඇමෙරිකානු ඩොලර් මිලියන 30-35.(US$ 30-35 Million)	2023-2026 දෙසැම්බර්

- UNDP - එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- JICA - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය
- World Bank - ලෝක බැංකුව
- WFP - ලෝක ආහාර වැඩසටහන
- CRIWMP - දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය

2. පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය

2.1.1. ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය (අනාවැකිකරණ අංශය)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරන ප්‍රමුඛතම කාර්යය භාරය වන දිවයින තුළ මෙන්ම දිවයින වටා වන මුහුදු ප්‍රදේශ ආශ්‍රිත කාලගුණික තත්ත්වයන් පිළිබඳව පැය 24 පුරාම ක්‍රියාත්මක වන පරිදි අනාවැකි පළ කිරීම, අවශ්‍ය අවස්ථාවන්වලදී අවවාදාත්මක අනාවැකි මෙන්ම අනතුරු ඇඟවීම් සිදුකිරීම, සුනාමි පිළිබඳ නිවේදන අදාල අවස්ථාවන්හිදී සිදු කිරීම මෙන්ම කෘෂිකාර්මික කටයුතු සහ බලශක්ති ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ කටයුතු සඳහා ද අවශ්‍ය කාලගුණික අනාවැකි සැපයීමත් සිදුවන්නේ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙනි.

මෙම මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂය තුළ නිකුත් කරන ලද අනාවැකි සහ පුර්ව අනතුරු ඇඟවීම් සංඛ්‍යාව පහත දැක්වේ.

අනාවැකි නිකුත් කිරීම	
අනාවැකිය	**අනාවැකි සංඛ්‍යාව**
මහජනතාව සඳහා	1116
ධීවර සහ නාවික කටයුතු	5737
බලශක්ති ක්ෂේත්‍රය	68
පුර්ව අනතුරු ඇඟවීම්	
තද වැසි තද සුළං	93
සුළි කුණාටු සහ අඩු පීඩන තත්ත්ව	107
අකුණු	69
මුහුදු ප්‍රදේශ	36
සුනාමි	08
විවිධ ආයතන සහ පුද්ගලික ඉල්ලීම් සඳහා නිකුත් කල අනාවැකි (GAC, CSCEC, PCD, Education Dept. CEB etc)	1196
කාලගුණ වාර්තා	
රක්ෂණ ආයතන සඳහා	31
ධීවර සහ නාවුක කටයුතු සම්බන්ධ ආයතන සඳහා	07
විවිධ පුද්ගලයින් සඳහා	21
වෙනත් ආයතන සඳහා	37

ඩයලොග් “Sayura” ධීවර කාලගුණ තොරතුරු සේවාව

ඩයලොග් අසියාටා ආයතනය සමග ධීවර ජනතාව වෙත දිවයින වටා කාලගුණික තත්වය දිනපතා ලබා දීම සහ අයහපත් කාලගුණික තත්ත්ව වලදී ක්ෂණිකව අවවාදාත්මක අනාවැකි මෙන්ම පූර්ව අනතුරු පිලිබඳ අනාවැකි ලබා දෙමින් ඉතා සාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.

මෙමගින් දිනකට අනූ හතර දහසකට (94,000) වැඩි ධීවර ජනතාවක් මේ හරහා කාලගුණ අනාවැකිය ලබාගන්නා බවත් පසුගිය වර්ෂයේ දී කෙටි පණිවිඩ මගින් මිලියන 2.1 පමණද දුරකථන ඇමතුම් හරහා අටසිය හැත්තෑ තුන් දහසකට (873,000) වැඩි ප්‍රමාණයක් ද කාලගුණ අනාවැකිය ලබා ගත් බව එම ආයතනය වාර්තා මගින් සනාත කර ඇත.

2.1.2. පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස අධ්‍යයන කේන්ද්‍රය

- "පසුගිය දශක දෙක තුළ (2001-2020) ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ නිරිතදිග මෝසම් වර්ෂාපතනය කෙරෙහි ඉන්දියානු සාගරයේ උණුසුම් වීමේ බලපෑම" පිළිබඳ පර්යේෂණ පත්‍රිකාව දේශගුණ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සඟරාවේ ප්‍රකාශයට පත් කරන ලදී. රුහුණු විශ්ව විද්‍යාලයේ සහයෝගයෙන් මෙය සිදු කර ඇත.
- කෘෂි කාලගුණ විද්‍යා උපදේශන සතිපතා නිකුත් කෙරේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ මහවැලි සමඟ ඒකාබද්ධව ජාතික කෘෂි කාලගුණ විද්‍යා උපදේශනයක් මාසිකව නිකුත් කෙරේ.
- 1950-2020 කාලය තුළ දේශගුණ විශ්ලේෂණය අවසන් කරන ලදී.
- ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනය (IWMI) සමඟ සහයෝගයෙන්, WRF භාවිතා කරමින් ශ්‍රී ලංකාව සඳහා IPCC හි නවතම ඇගයීම වාර්තාව අනුව ප්‍රශස්ත පරිමාණයකින් යුතුව නව දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපණය (Downscaled Climate Change Projections) සකස් කරමින් පවතී.
- නියඟ පිළිබඳ අධ්‍යයනය සඳහා PRISM මෘදුකාංගය ශ්‍රී ලංකාවට ගැලපෙන පරිදි යථාවත් කිරීමේ අධ්‍යයනයන් සිදු කෙරේ.
- 2020-2022 කාලය තුල නිකුත් කරන ලද මාසික සහ ත්‍රයිමාසික අනාවැකි සත්‍යාපන කටයුතු සිදු කරන ලදී.
- ඍතුමය සහ දිගුකාලීන අනාවැකි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් (කෘෂිකර්මයට සහ ජල කළමනාකරණයට අදාල) පලදායි ආකාරයෙන් ඉදිරිපත් කිරීමට හැකිවීම.
- මහජනතාවට මෙන්ම අවශ්‍ය පාර්ශ්වකරුවන්ට වඩා ඵලදායි ආකාරයෙන් දේශගුණ තොරතුරු ලබා දීමට සහ නියඟ තත්වයන් අදුනා ගැනීමට උපකාරී විය හැකි ලෝක ආහාර වැඩසටහන (WFP) හි සහාය ඇතිව PRISM දෘඩාංගය ස්ථාපිත කිරීමේ කටයුතු නිම කර ඇති අතර දෙපාර්තමේන්තු වෙබ් පිටුව හරහා මහජනතාව සඳහා විවෘත කල ඇත. මේ පිළිබඳ අදාළ

පාර්ශව ආයතන දැනුවත් කිරීමේ සම්මන්ත්‍රනයක් WFP හි සහාය ඇතිව දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේ දී පැවැත්වන් ලදී.

- දේශගුණ පුවත් (විද්‍යුත්) සඟරාව මාස 6 කට වරක් නිකුත් කරන ලදී.

- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ (IPCC) හි දේශීය කේන්ද්‍රය ලෙස දේශගුණ විපර්යාස පිළිබඳ කටයුතු දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමේ 4 වන වගන්තියේ, 12 වන ඡේදයට අනුව, පාර්ශවයන් විසින් සන්නිවේදනය කරන ලද NDCs ජාතික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- මාසික වර්ෂාපතන අනාවැකි සත්‍යාපන කටයුතු මාසිකව සිදු කරන ලදී
- දේශගුණ විපර්යාස පිළිබඳ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල ගුරුවරුන් 150 ක් දැනුවත්කිරීමේ වැඩ සටහන් මාලාවක් අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂි සහ පරිසර අමාත්‍යාංශ එක්ව පවත්වන ලදී. මේ සඳහා ලෝක අහාර වැඩ සටහන මූල්‍ය අනුග්‍රහය දක්වන ලදී. මෙහි සාර්ථක සහ වැදගත් බව හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මේ වැඩ සටහන් ලංකාවේ අනෙක් දිස්ත්‍රික්ක වල ද පැවැත්වීමට ඉල්ලීම් කර ඇත.
- මාසික නියංතත්ව වාර්තාව නිකුත් කරන ලදී.
- ජාතික කෘෂි උපදේශනය පිළියෙළ කිරීම සඳහා සඳහ වන තාක්ෂනික උපදේශන කමිටුව සඳහා අවශ්‍ය දේශගුණික තොරතුරු ලබා දෙන ලදී.

2.1.3. නිරීක්ෂණ ජාල සහ ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල

- ශ්‍රී ලංකාව සඳහා WIGOS මධ්‍යස්ථාන ලියපදිංචි කිරීමේ ජාතික සැලැස්ම (National Scheme of WIGOS Station Identifier) සකස් කිරීම.
- පොලොන්නරුව, මොණරාගල සහ මත්තල කාලගුණ විද්‍යා කාර්යාල සඳහා ලියාපදිංචි අංක නිකුත් කිරීම.
- කාලගුණ විද්‍යාත්මක දත්ත කේතීකරණ පද්ධතිය සඳහා සාම්ප්‍රදායික අක්ෂරාංක කේතීකරණ (TAC) පද්ධතියේ සිට ද්විමය විශ්ව ආකෘතියට (BUFR) කාලගුණ විද්‍යාත්මක නිරීක්ෂණ දත්ත බෙදා හැරීමේ පද්ධතියට උසස් කිරීම.
- දත්ත සංනිවේදනය අඛන්ඩව සිදු කිරීම සඳහා පරිගණක උපාංග වලට සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලෝක අහාර වැඩ සටහන (WFP) අනුග්‍රහයෙන් ලබා දෙන ලදී.

- කුරුණෑගල, මහඉල්ලුපල්ලම කාර්යාලවල පැවති අත්‍යවශ්‍ය අලුත් වැඩියා කටයුතු ඉටුකරන ලදී.
- ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් ගාල්ල කාර්යාලය සම්පූර්ණ අලුත්වැඩියා ව නිම කරන ලදී.
- බාහිර කාර්යාලයන්හි කාර්ය භාර නිලධාරීන්ගේ (OIC) වාර්ෂික සමුළුව සාර්ථකව පවත්වන ලදී.

2.1.4. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	පැමිණි සංඛ්‍යාව
පාසල් කණ්ඩායම් දැනුම්වත් කිරීම	122	13642
උසස් අධ්‍යාපන ආයතනදැනුම්වත් කිරීම	25	1266
ත්‍රිවිධ හමුදා කණ්ඩායම්දැනුම්වත් කිරීම	14	445
රාජ්‍ය/ පෞද්ගලික ආයතන හා වෙනත් සංවිධාන	20	678
• වැඩසටහන් 07 ක් සඳහා සම්පත් දායකත්වය ලබා දී ඇත		


2.1.5. සංඛ්‍යානමය අනාවැකි අංශය (NWP)

- ECMWF මොඩලයේ වැඩිදියුණු කරන ලද high resolution පුරෝකතන දත්ත බාගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කල අතර එමගින් කාලගුණ විද්‍යා පුරෝකතනයන් නිර්මාණය කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී. මෙහිදී කෙටිකාලීන, මධ්‍යකාලීන කාලගුණ විද්‍යා පුරෝකතනයන්, කෘෂිකර්ම අංශය, ධීවර හා නාවුක කටයුතු සඳහා, ගුවන්කාලගුණ කටයුතු සඳහා අවශ්‍ය පුරෝකතනයන් නිර්මාණයන් සිදුකිරීම.
- Web Portal සඳහා සෑම පැය 3කට වරක් ස්වයංක්‍රියව පුරෝකතන දත්ත යැවීම සඳහා ක්‍රමවේදයන් සකස්කිරීම.
- ECMWF සහ WRF මොඩලයන්ගේ පුරෝකතන නිරවද්‍යතාවයන් පිළිබඳ අධ්‍යයන කටයුතු සිදුකිරීම.
- Rainfall Interpolation ක්‍රමවේදයන් පිළිබඳ අධ්‍යයන් තුලින් වඩා නිවරදි Rainfall Interpolation ක්‍රමවේදය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදුකිරීම.
- මේ වනවිට WRF මොඩලය භාවිතා කරමින් 9Km විභේදනයක් සහිත ගණිතමය පුරෝකතන දින 10 ක් දක්වා සකස් කරන අතර නව පරිසණක පද්ධතියක් මගින් 3Km දක්වා එය වැඩිදියුණු කිරීම පරීක්ෂණ මට්ටමේ ක්‍රියාත්මකව පවතී. පුරෝකතන සත්‍යාපනය මාසිකව සිදු කරන අතර මාස 06 ක් දක්වා ගණිතමය ආකෘති මගින් පුරෝකතන සකස් කිරීම ද සිදු කෙරේ.

2.1.6. ඉලෙක්ට්‍රොනික අංශය

ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කාලගුණ විද්‍යා උපකරණ, පරිගණක ජාල, වන්ද්‍රිකා ග්‍රාහක පද්ධති ආදී පද්ධති අලුත්වැඩියාව සහ නිසි පරිදි නඩත්තු කොට පවත්වාගෙන යාමයි.

පහත සඳහන් පද්ධති හා උපකරණ සඳහා නිවාරණ නඩත්තු කටයුතු හා නියමිත කාල පරාසයන් තුල සිදු කලයුතු නඩත්තු කටයුතු සිදු කිරීමද වේ. ස්වයංක්‍රිය කාලගුණ මධ්‍යස්ථාන, ස්වයංක්‍රිය වර්ෂාමාන පද්ධති ජාල, ගෝලීය විදුලි සංදේශ පද්ධතිය (Global Telecommunication System - GTS), දෙපාර්තමේන්තු පරිගණක ජාලය (LAN), LGN පද්ධතිය, විදුලි උත්පාදක යන්ත්‍රය (Power Generator), CMACAST පද්ධතිය, HIMAWARICAST පද්ධතිය වැනි වන්ද්‍රිකා ප්‍රතිග්‍රහණ පද්ධති, දෙපාර්තමේන්තුවේ විදුලි පද්ධතිය, පරිගණක හා ඒ ආශ්‍රිත උපකරණ, Radiosonde පද්ධතිය, දෙපාර්තමේන්තු දුරකථන පද්ධතිය (PABX), වායුසමන යන්ත්‍ර සහ හයිඩ්‍රජන් උත්පාදක යන්ත්‍රය ඒවා අතර ප්‍රධාන වේ.



- පරිපාලන ගොඩනැගිල්ල සහ සම්මන්ත්‍රණ ශාලාව සඳහා අකුණු ආරක්ෂකයන් ස්ථාපනය කිරීම.
- අකුණු ආරක්ෂණ පද්ධතිය සහ ජාලකරණ පද්ධතිය ස්ථාපනය කිරීම.
- විවේක කාමර ගොඩනැගිල්ලෙහි විදුලි පද්ධතිය සඳහා BOQ සහ සැලසුම් සකස් කිරීම.

- රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව, SLIDA, DMC, NBRO හි තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහභාගී වීම.
- උපකරණ කොටුව හා මුර කුටිය සඳහා නව විදුලි පරිපථය ස්ථාපනය කිරීම.
- BUFER කේත මගින් දත්ත සන්නිවේදනය සඳහා තාක්ෂණික සහය ලබාදීම

2.1.7. උපකරණ අංශය

- 2023 වසරේදී සම්ප්‍රදායික උපකරණ 212 ක් හා ඉලෙක්ට්‍රොනික උපකරණ 13 ක් ක්‍රමාංකනය කර ඇත.සාම්ප්‍රදායික උපකරණ 107 ක් හා ඉලෙක්ට්‍රොනික උපකරණ 19 ක් නිකුත් කර ඇති අතර, ක්‍රමාංකන සහතික හා පරිවර්තී වගු 62 ක් නිකුත් කර ඇත.කාර්මික අංශය මගින් උපකරණ 25ක් අලුත්වැඩියාකරඇත.
- ප්‍රදර්ශන සඳහා පාසැල් 12 ක් වෙත ප්‍රදර්ශන උපකරණ සපයා ඇති අතර , පාසැල් දෙකක හා වෙනත් බාහිර ආයතන එකක පැවති ප්‍රදර්ශන සඳහා සම්පත් දායකත්වය ලබාදී ඇත.
- නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා සම්පත් දායකත්වය ලබාදී ඇත.
- ජේතවනාරාමයේ ගර්භයේ පැලීම් සඳහා විසඳුම් සෙවීමේ කමිටුවට ගර්භය මතුපිට උෂ්ණත්වය නිර්ණය කිරීම සඳහා සහය විය.
- කරදියාන සන අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ ඇති කාලගුණ විද්‍යා උපකරණ පරීක්ෂාව සිදුකරන ලදී.
- මාකඳුර කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා සම්පත් දායකත්වය ලබාදී ඇති අතර ක්‍රියාවිරහිතව තිබූ උෂ්නත්වමාන සඳහා නව උෂ්නත්වමාන ලබා දෙන ලදී.

2.1.8. දත්ත සැකසුම් හා සංරක්ෂණ අංශය

- කාලගුණ දත්ත සංරක්ෂණය කිරීම සහ CLICOM සහ CLIMSOFT පද්ධති නඩත්තු කිරීම
- දේශගුණික දත්තවල දත්ත ඇතුළත් කිරීම සහ තත්ත්ව පාලනය පවත්වාගෙන යාම සහ දේශගුණික දත්ත (දළ සහ සැකසූ) පාරිභෝගිකයාට සැපයීම.
- මාසික කාලගුණ සාරාංශ සහ වාර්ෂික කාලගුණ සාරාංශ වාර්තා සඳහා දේශගුණික දත්ත සහ දේශගුණ සිතියම් සැපයීම
- අන්තර්ජාලය හරහා දත්ත සැපයීම.
- කාලගුණ මධ්‍යස්ථාන සිතියම (ප්‍රධාන කාලගුණ මධ්‍යස්ථාන , වැසි මාපක ස්ථාන සහ කෘෂි කාලගුණ මධ්‍යස්ථාන) වෙබ් අඩවියට උඩුගත කර ඇත.

- වෙබ් අඩවියට උඩුගත කරන ලද වර්ෂාපතනය සහ උෂ්ණත්වය (උපරිම සහ අවම) පිළිබඳ දත්ත ලබා ගැනීමේ ලැයිස්තුව (සබැඳි සේවාව හඳුන්වා දීමෙන් පසු, දත්ත සැපයීම් 75% ක් අන්තර්ජාලය හරහා සිදු කෙරේ).

<u>දත්ත පද්ධති තොරතුරු (Database status)</u>

➢ **දෛනික දත්ත**

ප්‍රධාන මධ්‍යස්ථාන (Main Stations)	වර්ෂාපතනය/උෂ්ණත්වය උපරිම/උෂ්ණත්වය අවම	ආරම්භයේ සිට 2023 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කර ඇත
	RH (දිවා සහ රාත්‍රී)	1996 සිට 2023 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කර ඇත
වැසි මාපක	වර්ෂාපතනය	ආරම්භයේ සිට 2023 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කර ඇත

➢ **මාසික දත්ත**

ප්‍රධාන මධ්‍යස්ථාන (Main Stations)	වලාකුළු ආවරණය / සුළං වේගය	1980 සිට 2023 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කරන ලදී
	අකුණු සහිත දින ගණන	2008 සිට 2023 දෙසැම්බර් දක්වා යාවත්කාලීන කරන ලදී

➢ **2023 දෙසැම්බර් 31 දක්වා නිකුත් කරන ලද දත්ත**

දළ /සහතික කළ දත්ත

මාසය	දත්ත වාර්තා ගණන	වටිනාකම (රු.)
ජනවාරි සිට දෙසැම්බර් දක්වා	937	4,032,205.00

නොමිලේ දත්ත (ශිෂ්‍යයන්, අනුමත රාජ්‍ය ආයතන)

මාසය	දත්ත වාර්තා ගණන
January to December 2023	128

2.1.9. වර්ෂාපතන, දත්ත, දේශගුණ අංශ

- දේශගුණ අංශ මගින් ප්‍රාදේශීය කාලගුණ මධ්‍යස්ථාන 23 කින් සහ කොළඹ ප්‍රධාන කාර්යාලයේ ජා.කා.ම මගින් පැය තුනකට වරක් ලබාදෙන දත්ත තත්ත්වපාලනය, සංරක්ෂණය බාහිර පාර්ශවයන් සඳහා දත්ත නිකුත් කිරීම සිදුකරයි. 2023 වර්ෂයේදී දත්ත අලෙවියෙන් ලද ආදායම රු 842,030.00 කි.
- දත්ත අංශය මගින් අඛණ්ඩව දත්ත සටහන් කෙරෙන උපකරණවල (උෂ්ණත්වමාන, ආර්ද්‍රතාමාන, වර්ෂාමාන, පීඩනමාන ප්‍රස්ථාර හා සූර්යයදීප්තමාන කාඩ්පත්වල) දත්ත තත්ත්වපාලනය හා සංරක්ෂණය කිරීම, සුළඟේ වේගය හා දිශාව මාසිකව ගණනය කිරීම, සූර්යයදීප්ත පැය ගණන පරීක්ෂා කිරීම මෙන්ම බාහිර පාර්ශවයන් සඳහා දත්ත නිකුත් කිරීම සිදුකරයි.

2.1.10. කෘෂි කාලගුණ විද්‍යා අංශය

- 2023 වසරෙදි මෙම අංශයෙන් දත්ත බාහිර පුද්ගලයන් වෙත ලබා දීමන් රු. 654,630.00 ක අදායමක් ලබා ඇත.
- සතිපතා කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශනය නිකුත් කිරීමට කටයුතු කරන ලදී.
- කෘෂි කාලගුණික මධ්‍යස්ථාන 45 ක නිලධාරීන් සඳහා ගන්නොරුව නේවාසික පුහුණු මධ්‍යස්ථානයේදී එක්දින නේවාසික පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.
- මාකඳුර කෘෂි කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු, විෂයට අදාලව දැනුවත් කිරීම් හා අධීක්ෂණ කටයුතු සිදු කරන ලදී.

2.2. අභියෝග

- විශේෂ රාජකාරීන් සඳහා අවශ්‍යවන කාර්යමණ්ඩල හිඟය.
- රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස නව බදවා ගැනීම් අත්සිටුවා තිබීම.
- දෙපාර්තමේන්තුව සතුව සීමිත වාහන ප්‍රමාණයක් පමණක් පැවතීම හේතුවෙන් දිවයින පුරා පැතිර තිබෙන නිරීක්ෂණ ජාලය ප්‍රශස්ත මට්ටමෙන් නඩත්තු කිරීම සඳහා වාහන, ප්‍රවාහන පහසුකම්, නවාතැන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ විශේෂඥ උපදේශන සේවය සඳහා මුදල් නිශ්චිතව වෙන්කළ ඇති නමුත් නවීකරණ හා ස්ථාපනය කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයන් නිශ්චිතව වෙන් වී නොමැති වීම.

- ඩොප්ලර් රේඩාර් ව්‍යාපෘතිය ජපන් මුල්‍යමය ආධාර මත සිදු කෙරෙන්නක් බැවින් ජපන් රජයේ ජාත්‍යන්තර ප්‍රතිපත්තීන්ට අනුකූලව කටයුතු කිරීමට සිදු වීම.
- 1861 පමණ පැරණි දේශගුණික දත්ත (උෂ්ණත්වය, වර්ෂාපතනය, පීඩනය, ආර්ද්‍රතාවය, වාෂ්පීකරණය, සුළඟ, දෘශ්‍යතාව, වලාකුළු ආවරණය, හිඟුරුම්, මීදුම, හිරු එළිය සහ සාමාන්‍ය, ආන්තික අගයන් සහ සංඛ්‍යාත වැනි ව්‍යුත්පන්න දේශගුණ පරාමිතීන්) බොහොමයක් තවමත් කඩදාසි ආකාරයෙන් පවතින අතර ඒවා විනාශවීමේ අවධානමක පවතින අතර තවමත් පරිගණකගත (digitalized) කර නොමැත. ඓතිහාසික දේශගුණික දත්ත සංරක්ෂණය කිරීම සහ පරිගණකගත කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති වීම.
- සංඛ්‍යානමය කාලගුණ විද්‍යා පුරෝකතනයන් හා දේශගුණ පුරෝකතනයන් සැකසීම සඳහා වූ විශේෂිත දැනුම ලබා ගැනීමට අවශ්‍ය, විදේශ පුහුණු සඳහා මුල්‍ය ප්‍රතිපාදන නොමැති වීම.
- දේශගුණ හා කෘෂි කාලගුණ දත්ත පද්ධතිය යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යාම සඳහා විධිමත් ක්‍රමයක් දැනට නොමැති වීම.
- දිවා රාත්‍රී රාජකාරියේ යෙදෙන ජාතික කාලගුණ මධ්‍යස්ථානයේ හා පුර්ව අනතුරු ඇගවීමේ මධ්‍යස්ථානය පිහිටි ප්‍රධාන කාර්යාලයේ හදිසි හා අත්‍යවශ්‍ය කාරණයක් සඳහා රාත්‍රී කාලයේදී යෙදවීමට රියදුරෙක් හා වාහනයක් සඳහා ප්‍රතිපාදන නොමැති වීම.

2.3. ඉදිරි ඉලක්ක

- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම

ප්‍රධාන වශයෙන් ගංවතුර ආපදා අවම කරගැනීම සඳහා වාරිමාර්ග අමාත්‍යයංශය යටතේ ක්‍රියාත්මක වන "දේශගුණික තත්වයන්ට ඔරොත්තු දීමේ බහු-අදියර ක්‍රමලේඛ ප්‍රවේශය"(CresMPA) ව්‍යාපෘතිය මගින් වඩාත් ඵලදායි සේවාවක් සැපයීම පෙරදැරි කරගනිමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය හරහා නවීන තාක්ෂණික උපකරණ භාවිතයෙන් කාලගුණ විද්‍යාවට අදාල තොරතුරු ලබා ගැනීම, විශ්ලේෂණය හා අදාළ පාර්ශවයන් වෙත බෙදාහැරීම, මානව සම්පත් ධාරිතා වර්ධනය කිරීම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව නවීකරණ ව්‍යාපෘතියට අදාලව ජාත්‍යන්තර මට්ටමේ උපදේශන සේවාවක් හරහා දෙපාර්තමේන්තුවේ නවීකරණයට අදාල කටයුතු සිදු කිරීම සැලසුම් කර ඇත.

- පුත්තලම රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීම

තත්‍ය කාලීන වර්ෂාපතන නිරීක්ෂණ හැකියාව ශක්තිමත් කිරීම මගින් කාලගුණය ආශ්‍රිත ආපදා වලින් සිදුවන හානිය අවම කිරීමට දායක වීම ඩොප්ලර් රේඩාර් පද්ධතියක් ස්ථාපනය කිරීමේ ප්‍රධාන අරමුණ වේ.

2017 වසරේදී ආරම්භ කරන ලද ඩොප්ලර් රේඩාර් ව්‍යාපෘතිය COVID-19 වසංගතය, COVID වසංගත තත්ත්වය හේතුවෙන් මිල ඉහළ යාම සහ ජපාන රජයෙන් අමතර අරමුදල් ලබා ගැනීමේ දුෂ්කරතා ඇතුළු නොවැලැක්විය හැකි කරුණු ගණනාවක් හේතුවෙන් ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය 2024 වසරේදී නැවත සක්‍රිය කර 2026 වසර අවසානයේ දී නිම කිරීමට කඩිනමින් කටයුතු කෙරේ.

- කාලගුණ රේඩාර් භාවිතයෙන් ධාරිතා ගොඩනැගීමේ ව්‍යාපෘතිය

ඩොප්ලර් රේඩාර් ව්‍යාපෘතියට සමගාමීව ජපන් මූල්‍යමය ආධාර හරහා ආපදා අනතුරු ඇඟවීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ධාරිතාව වැඩි දියුණු කිරීම ප්‍රධාන අරමුණ වේ.

මෙමගින් ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථාන (AWS) හරහා නිරීක්ෂණ ජාලය වැඩි දියුණු කිරීම, සංඛ්‍යාත්මක කාලගුණ අනාවැකි (NWP) ආකෘතියක් සහ අති නවීන කාලගුණ රේඩාර් වැනි නව උපකරණ සහ තාක්ෂණය හඳුන්වාදීම ,විශ්ලේෂණ ධාරිතාව නැංවීම, අධික වර්ෂාපතන තොරතුරු නිසි ලෙස නිකුත් කිරීම සහ බෙදා හැරීම සහ අලුතින් හඳුන්වා දීමට නියමිත ධ්‍රැවීය කාලගුණ රේඩාර් හි ස්ථායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම මගින් කාලගුණ නිරීක්ෂණ, විශ්ලේෂණය, පුරෝකථනය සහ තොරතුරු බෙදා හැරීම සඳහා දෙපාර්තමේන්තු හැකියාව වැඩිදියුණු කිරීම සඳහා කටයුතු ආරම්භ කල අතර 2026 වසර දක්වා මෙම කටයුතු සිදු කරනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව වැනි පාර්ශ්වකරුවන්ට ද ප්‍රතිලාභ ලැබෙන සේ දත්ත හා තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා digital platform නිර්මාණය කරණු ලැබේ.

- දේශගුණ තොරතුරු ලබා දීම

දේශගුණික විපර්යාස සහ සබැඳි සංවේදී ක්ෂේත්‍ර එනම් කෘෂිකර්මන්තය, ජල කළමනාකරණය, ආපදා කළමනාකරණය, බලශක්ති සහ සෞඛ්‍ය ක්ෂේත්‍ර වල ක්‍රියාකාරකම් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන බැවින් දේශගුණික විපර්යාස සහ විචලනය හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම පිළිබඳ දැඩි අවධානයක් යොමුවී ඇත. දේශගුණික සේවාව නවීකරණය කරමින් දේශගුණික සංවේදී ක්ෂේත්‍ර සඳහා තීරණ ගැනීමට පහසු අයුරින් ඉහල උපයෝගීතාවයක් ලැබෙන පරිදි දේශගුණ තොරතුරු ලබා දීම වැඩි දියුණු කරණු ලැබේ.

- දේශීය කෘෂි කර්මාන්තය සඳහා වගකිවයුතු ආයතන හරහා අවසාන පරිශීලක ගොවියා දක්වා වඩා ඵලදායිව කෘෂි කාලගුණ තොරතුරු සැපයීමට කටයුතු කිරීම.
- දිගු කාලයක් නිසි ලෙස නඩත්තු කිරීමට නොහැකිව අබලන්ව ඇති බාහිර කාර්යාල අලුත්වැඩියා කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව


A.K. Karunanayake
Director General
Department of Meteorology
383, Bauddhaloka Mawatha,
Colombo 07.

3. පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය ප්‍රකාශන

3.1.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිඒ-එල්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		2023 රු.	2022 රු.
	ආදායම් ලැබීම්		
	බදු නොවන ආදායම් හා වෙනත්	-	-
	මුළු ආදායම් ලැබීම් (අ)	-	-
	ආදායම් නොවන ලැබීම්		
	භාණ්ඩාගාර අග්‍රිම	405,950,000.00	349,928,000.00
	නැන්පතු	1,506,282.10	5,942,376.28
	අත්තිකාරම් ගිණුම්	11,359,771.18	10,569,282.41
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්	-	-
	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)	**418,816,053.28**	**366,439,658.69**
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)	**418,816,053.28**	**366,439,658.69**
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)	**631,428.97**	**74,211.60**
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)	**418,184,624.31**	**366,365,447.09**
	අඩුකළා : වියදම්		
	පුනරාවර්තන වියදම්		
271,290,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	263,712,341.59	269,513,492.36
97,310,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	92,217,382.24	57,110,018.36
27,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	25,644,465.75	24,966,680.33
396,300,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**	**381,574,189.58**	**351,590,191.05**
	මූලධන වියදම්		
6,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	6,134,366.09	3,037,190.73
60,450,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	43,046,113.66	13,240,551.85
1,500,000	හැකියා වර්ධනය	836,271.50	1,356,049.50
50,650,000	වෙනත් මූලධන වියදම්	202,376.71	-
118,800,000	**මුළු මූලධන වියදම් (උ)**	**50,219,127.96**	**17,633,792.08**
	නැන්පතු ගෙවීම්	1,805,361.14	4,983,495.68
	අත්තිකාරම් ගෙවීම්	13,067,176.78	9,710,338.00
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්	-	-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)	**14,872,537.92**	**14,693,833.68**
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)	**446,665,855.46**	**383,917,816.81**
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)	**(28,481,231.15)**	**(17,552,369.72)**
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය	**(28,481,231.15)**	**(17,552,369.72)**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය	-	-
515,100,000		**(28,481,231.15)**	**(17,552,369.72)**

1

3.1.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	තක්‍ය 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්		
දේපළ, පිරියත හා උපකරණ	3,930,193,265.88	3,880,946,331.37
මූල්‍ය වත්කම්		
අත්තිකාරම් ගිණුම්	23,702,674.40	21,995,268.80
මුදල් හා මුදල් සමාන දෑ	-	-
මුළු වත්කම්	**3,953,895,940.28**	**3,902,941,600.17**
ශුද්ධ වත්කම් / ස්කන්ධය		
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්	22,204,823.00	20,198,338.36
දේපළ, පිරියත හා උපකරණ සංචිතය	3,930,193,265.88	3,890,031,063.22
ජංගම වගකීම්		
කැන්පතු ගිණුම්	1,497,851.40	1,796,930.44
අග්‍රිම ශේෂය	-	-
මුළු වගකීම්	**3,953,895,940.28**	**3,912,026,332.02**

පිටු අංක 6 සිට 25 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 26 සිට 34 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම් : ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී
එන්ඩීසී පීඑස්සී එම්ඉල්
තනතුර : ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය
දිනය : 2024.02. 27

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ඉල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

.....
ගණන්දීමේ නිලධාරී
නම : ඒ.කේ.කරුණානායක
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2024.02. 15

ඒ.කේ. කරුණානායක
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : එස්.අඟිලන්
දිනය : 2024.02. 15

එස්. අඟිලන්
ප්‍රධාන ගණකාධිකාරි
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

2

3.1.3. මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

තක්‍ය

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	20,166,941.23	18,542,483.45
අග්‍රිම ලැබීම්	405,950,000.00	349,928,000.00
අත්තිකාරම් අයකර ගැනීම්	11,064,177.40	11,114,828.41
තැන්පතු ලැබීම්	1,506,282.10	5,942,376.28
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**438,687,400.73**	**385,527,688.14**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	352,094,552.83	329,341,640.87
සහනාධාර සහ මාරුකිරීම්	25,644,465.75	24,966,680.33
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,068,849.75	3,210,769.81
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	631,428.97	74,211.60
අත්තිකාරම් ගෙවීම්	12,893,299.00	9,710,338.00
තැන්පතු ගෙවීම්	1,805,361.14	4,983,495.68
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**395,137,957.44**	**372,287,136.29**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**43,549,443.29**	**13,240,551.85**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	43,549,443.29	13,240,551.85
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**43,549,443.29**	**13,240,551.85**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(43,549,443.29)**	**(13,240,551.85)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.1.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2023 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොඉලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් **31** දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.2. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ.					

3.3. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	374,300,000.00	396,300,000.00	381,574,189.58	96%
ප්‍රාග්ධන	118,800,000.00	118,800,000.00	50,219,127.96	42%

3.4. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
අදාල නොවේ.						

3.5. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2023** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	278,325,000.00	278,325,000.00	-	-
9152	යන්ත්‍රෝපකරණ	371,132,563.18	371,132,563.18	-	-
9153	ඉඩම්	3,280,735,702.70	3,280,735,702.70	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.6. විගණකාධිපතිවරයාගේ වාර්තාව

2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්තාව අවසානයේ ඇමුණුමක් (ඇමුණුම 01) ලෙස අමුණා ඇත.

4. පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ පුතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%-74%**
1. පූර්ව අනතුරු ඇඟවීම් නිසිකලට නිකුත් කිරීම	100%	-	-
2. නිරීක්ෂණ ජාල වැඩි දියුණු කිරීම	-	80%	-
3. අනාවැකිකරණ වල නිරවද්‍යතාවය ඉහළ දැමීම	-	-	50%
4. මහජන කාලගුණ සේවාව ඉහළ නැංවීම	-	-	50%
5. සංඛ්‍යානමය අනාවැකි (NWP) වැඩි දියුණු කිරීම	-	80%	-
6. සෘතුමය අනාවැකි වැඩි දියුණු කිරීම	-	75%	-
7. දේශගුණ පුරෝකතන සැපයීමේ ධාරිතාවය ඉහළ නැංවීම	-	80%	-
8. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරී ධාරිතාවය ඉහළ නැංවීම	-	75%	-

5. පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

අරමුණු	**13.** දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීමට කඩිනම් පියවර ගැනීම

දේශීය ඉලක්ක	දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0% - 49%	50% - 74%	75%- 100%
13.1 කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.				
13.1.a	13.1.a			
වඩාත් විශ්වාසදායක කාලගුණ සහ දේශගුණික තොරතුරු, අනාවැකි සහ අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම	• කාලගුණ ඩොප්ලර් රේඩාර් පද්ධතිය (JICA) ස්ථාපනය කිරීම	X		
	• දෙපාර්තමේන්තුවේ ධාරිතා ගොඩනැගීමේ ජයිකා ව්‍යාපෘතිය (JICA – Capacity Building Project) ක්‍රියාත්මක කිරීම	X		
	• කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකු ණය යටතේ) ක්‍රියාත්මක කිරීම	X		
	• පුද්ගලික පොදු හවුල්කාරිත්වය (Private Public Partnership) මගින් කාලගුණ තොරතුරු අවසාන පරිශීලකයා (end user) දක්වා සැපයීම වැඩි දියුණු කිරීම			X
	• පොදු මහජන හවුල්කාරිත්වය (Public Public Partnership) මගින් කාලගුණ තොරතුරු අවසාන පරිශීලකයා (End user) දක්වා සැපයීම වැඩි දියුණු කිරීම		X	
13.1.b	13.1.b			
බලපෑම මත පදනම් වූ අනාවැකි ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	• බාහිර පාර්ශවයන්ගේ (stake holders) අවශ්‍යතාවයන්ට අනුව තොරතුරු, දත්ත හා සහය ලබා දීම.			X
	• ඒ සඳහා දෙපාර්තමේන්තු සේවකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීම.			X

දේශීය ඉලක්ක	දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0% - 49%	50% - 74%	75%- 100%
13.1.c	13.1.c			
අනාවැකි මත පදනම් වූ ක්‍රියා	• අයහපත් කාලගුණ තත්වයන් පිලිබඳව අනතුරු ඇගවීමේ යාන්ත්‍රණය වඩාත් ශක්තිමත් කිරීම			X
13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට දේශගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම.				
13.2.a	13.2. a			
ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් සඳහා අනාගත දේශගුණ ප්‍රක්ෂේපණ (දර්ශන/නිරීක්ෂණ) තොරතුරු සැපයීම	• දේශගුණ පුරෝකථන පිළියෙළ කිරීම වැඩි දියුණු කිරීම		X	
13.2.b	13.2. b			
සෘතුමය අනාවැකි සැපයීම	• සෘතුමය අනාවැකි පිලිබඳව අනතුරු ඇගවීමේ යාන්ත්‍රණය වඩාත් ශක්තිමත් කිරීම.			X
13.2.c	13.2.c			
අසීමාන්තික අනාවැකි (Seamless forecast) සැපයීම	• ගණිතමය ආකෘති (NWP) මගින් අනාවැකි සැපයීම වැඩි දියුණු කිරීම.			X
	• ගෝලීය පුරෝකථන පාදක කර ශ්‍රී ලංකාවට සරිලන සේ ඉදිරි වසර 100 සඳහා ප්‍රක්ෂේපන වැඩි දියුණු කිරීම		X	
13.3 දේශගුණ වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම් අවම කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.				
13.3.a	13.3.a			
දේශගුණික විපර්යාස බලපෑම්,අවම කිරීම් සහ අනුගතවීම් පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	• ගුරු මහත්ම මහත්මීන් දැනුවත් කිරීම.		X	
	• රජයේ නිලධාරින් දැනුවත් කිරීම		X	
	• පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම			X

දේශීය ඉලක්ක	දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
		0% - 49%	50% - 74%	75%- 100%
13.3.b	13.3.b			
කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම	• විදේශීය පුහුණු හරහා නව දැනුමෙන් සන්නද්ධ කිරීම		X	
	• එකී දැනුම දේශීය පුහුණු වැඩ සටහන් හරහා අනෙකුත් අය හා බෙදා ගැනීම.			X
13.3.c	13.3.c			
උපද්‍රවයන් හඳුනා ගැනීම	• දේශගුණ විපර්යාස අනුව උපද්‍රවයන්ගේ ආන්තිකරණ තත්වයන් හා සුලබතාව පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම.			X
13.3. d	13.3.d			
උපද්‍රව සිතියම්ගත කිරීම	• උපද්‍රව සිතියම්ගත කිරීම සඳහා අපදා කළමනාකරණ මධ්‍යස්ථානයට සහය වීම			X
13.B අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින් වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තිකරණයට ලක්වූ ප්‍රජාවන් ද ඉලක්ක කරගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.				
13.B.a	13.B.a			
ජාතික අනුගතවීමේ සැලැස්ම සකස් කිරීමට සම්බන්ධ වීම	• ජාතික අනුගතවීමේ සැලැස්ම සඳහා දේශගුණ/දේශගුණ වෙනස් වීම් තොරතුරු ලබා දීම.			X
13.B.b	13.B.b			
ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් සැකසීමට සම්බන්ධ වීම	• ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් සැකසීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දායකත්වය නිශ්චිතව නිර්ණය කිරීමට සහය වීම			X
13.B.c	13.B.c			
විවිධ තත්වයන් යටතේ අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපණ සකස් කිරීම සංවර්ධනය කිරීම	• විවිධ තත්වයන්ට සකස් කල දේශගුණික ප්‍රක්ෂේපණ		X	

* තිරසර සංවර්ධන ඉලක්ක, සංශෝධනය කර ඇත.

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින්

5.2.1. තිරසර සංවර්ධන ඉලක්කවල ප්‍රගතිය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යය භාරයන්ට සෘජුව සම්බන්ධ වන තිරසාර සංවර්ධන ඉලක්කය වන්නේ 13 වන ඉලක්කයයි. එනම් 'දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට හදිසි පියවර ගැනීම' යි. උක්ත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා තීරණ ගන්නා පාර්ශවයන්ට දේශගුණික විපර්යාසයන්හි බලපෑම් වලට අනුගත වීම සහ සාමාන්‍ය හෝ ආන්තික දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා අදාළ විද්‍යාත්මක කරුණු හා විශ්ලේෂණයන් ලබා දීම මෙන්ම අවශ්‍ය අවස්ථා වලදී අනාවැකි හා පූර්ව අනතුරු ඇගවීම් ලබා දීමද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි. ගෝලීය මාතෘකාවක් වන දේශගුණික විපර්යාස පිළිබඳව වූ පැරිස් ගිවිසුමට සහාය දැක්වීමට සහ "ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්" අනුව විමෝචන අවම කිරීමේ ක්‍රියාමාර්ගයන්ට මග පෙන්වීමට අවශ්‍ය දත්ත, පුරෝකථනයන් සහ පර්යේෂණ කටයුතු සඳහා සහයෝගය ලබා දෙන අතර කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ලංකාවේ "දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය (IPCC)" නාභීය ලක්ෂ්‍යය (Focal point) ලෙස ද කටයුතු කරයි.

ගෝලීය තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට "අංක 13: දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීමට කඩිනම් පියවර ගැනීම " සඳහා ප්‍රධාන ඉලක්ක හතරක් (13.1, 13.2,13.3 හා 13.B) යටතේ ක්‍රියාකාරී වීම සිදුවන අතර ඒවා වඩා ඵලදායි කරමින් දේශීය යාන්ත්‍රණයට අනුගත වන පරිදි එම ප්‍රධාන ඉලක්ක තවත් පුළුල් කරමින් ඒවා අනු කොටස් ලෙස සලකා කටයුතු කෙරේ.

අරමුණ කරා ලගා වීම සඳහා හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව) පහත දක්වා ඇත.

අරමුණු: **13. දේශගුණික විපර්යාස සහ එහි බලපෑමට එරෙහිව සටන් කිරීමට කඩිනම් පියවර ගැනීම**

දේශීය ඉලක්ක	**අරමුණ කරා ලඟා වීම සඳහා හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව)**
13.1 කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.	
13.1.a	13.1. a
වඩාත් විශ්වාසදායක කාලගුණ සහ දේශගුණික තොරතුරු, අනාවැකි සහ අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම	• දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ඩොප්ලර් රේඩාර් පද්ධතිය (JICA) ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය, දෙපාර්තමේන්තුවේ ධාරිතා ගොඩනැගීමේ ජයිකා ව්‍යාපෘතිය (JICA – Capacity Building Project) ව්‍යාපෘතිය හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකු ණය යටතේ) ක්‍රියාත්මක වෙමින් පවතී. නොවැලැක්විය හේතූන් නිසා ව්‍යාපෘතීන් ප්‍රමාද වුවත් අදාළ ව්‍යාපෘතින් යටතේ වඩාත් විශ්වාසදායක කාලගුණ සහ දේශගුණික තොරතුරු, අනාවැකි සහ අයහපත් කාලගුණ අනතුරු ඇඟවීම් සැපයීම අරමුණු වේ. • ඩයලොග් අසියාටා ආයතනය සමග ධීවර ජනතාව වෙත දිවයින වටා කාලගුණික තත්වය දිනපතා ලබා දීම සහ අයහපත් කාලගුණික තත්ත්ව වලදී ක්ෂණිකව අවවාදාත්මක අනාවැකි මෙන්ම පූර්ව අනතුරු පිලිබඳ අනාවැකි ලබා දෙමින් ඉතා සාර්ථක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී.
13.1. b	13.1. b
බලපෑම මත පදනම් වූ අනාවැකි ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	• බාහිර පාර්ශවයන්ගේ (stake holders) අවශ්‍යතාවයන්ට අනුව තොරතුරු, දත්ත හා සහය ලබා දීම. • CRIWMP ව්‍යාපෘතිය අනුග්‍රහයෙන් කෘෂි කාලගුණ තොරතුරු ලබාදීම සහ සෘතුමය අනාවැකි වැඩි දියුණු කිරීම සඳහා ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් පුහුණුවක්

දේශීය ඉලක්ක	**අරමුණ කරා ලඟා වීම සඳහා හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව)**
	ලබා දෙන ලදී. ඒ අනුව සතිපතා අනාවැකිය සේවා දායකයිනට වඩා සුදුසු ආකාරයට ලබාදීමට කටයුතු කරන ලද අතර සෘතුමය අනාවැකිය සඳහා Xcast මෙවලම හරහා නව අනාවැකියක් යොදා ගැනීමට කටයුතු කරන ලදී.
13.1.c	13.1.c
අනාවැකි මත පදනම් වූ ක්‍රියා	• මාසිකව නිකුත් කරන ලද ජාතික කෘෂි කාලගුණ උපදේශනය සඳහා කාලගුණ සහ දේශගුණ තොරතුරු ලබාදීමෙන් කෘෂි කර්මාන්තයෙන් ලැබෙන පලදාව වැඩි කිරීමටත් කාලගුණ සහ දේශගුණ ආපදා මගින් වන හානිය අවම කර රටේ ආර්ථිකය නගා සිටුවීමට සක්‍රීය දායකත්වය ලබා දෙන ලදී.
13.2 ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් සහ සැලසුම්වලට දේශගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම	
13.2.a	13.2. a
ජාතික ප්‍රතිපත්ති, උපාය මාර්ග සහ සැලසුම් සඳහා අනාගත දේශගුණ ප්‍රක්ෂේපණ (දර්ශන/නිරීක්ෂණ) තොරතුරු සැපයීම	• IPCC මගින් නිකුත් කරන ලද සය වන ඇගයීම් වාර්තාව ට අනුව අනාගත දේශගුණ පුරෝකතන පිලියෙල කිරීමේ ජාතික දේශගුණ අනුගතවීමේ සැලැස්මට සමගාමීව කටයුතු IWMI සහ පරිසර අමාත්‍යාංශය සමග එක්ව ආරම්භ කරන ලදී.
13.2.b	13.2. b
සෘතුමය අනාවැකි සැපයීම	• සෘතුමය සහ මාසික අනාවැකි ඉදිරි මාස 3ක් සඳහා මාසිකව නිකුත් කරන ලදී. • විද්‍යුත් තැපෑල සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් මෙන්ම මාසිකව පැවැත්වෙන කෘෂි කාලගුණ උපදේශන තාක්ෂනික උපදේශන සභාවේදී මෙම තොරතුරු අදාළ ආයතන වලට ලබා දෙන ලදී. විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා ද මෙම තොරතුරු මහජනතාව වෙත සම්ප්‍රේෂණය කරන ලදී.
13.2.c	13.2.c

දේශීය ඉලක්ක	අරමුණ කරා ලඟා වීම සඳහා හදුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව)
අසීමාන්තික අනාවැකි (Seamless forecast) සැපයීම	• තවද ඉදිරි පැය 24 සහ 36 සඳහා දිනපතා කාලගුණ අනාවැකි ද ඉදිරි දින 9 ක් සඳහා දිනපතා ද සහ ඉදිරි සති 4ක් සඳහා සතිපතා ද, ඉදිරි මාස 3ක් සඳහා මාසික අනාවැකි නිකුත් කරනු ලැබේ. • IPCC, AR 06 අනුව ගෝලීය පුරෝකථන ශ්‍රී ලංකාවට සරිලන සේ ඉදිරි වසර 100 සඳහා සකස් කිරීම ආරම්භ කරන ලදී.
13.3 දේශගුණ වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම	
13.3.a	13.3.a
දේශගුණික විපර්යාස බලපෑම්,අවම කිරීම් සහ අනුගතවීම් පිළිබඳ දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	• ලෝක අභාර වැඩ සටහන යටතේ දේශගුණ විපර්යාස පිළිබඳ මෙන්ම ඒ සඳහා අනුගත වන අයුරු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් මාලාවක් අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම සහ පරිසර යන අමාත්‍යාංශය සමග එක්ව ආරම්භ කරන ලදී. මෙමගින් කොළඹ සහ ගම්පහ යන දිස්ත්‍රික්ක වල ගුරු මහත්ම මහත්මීන් 150 කට වඩා වැඩි පිරිසක දැනුවත් කරන ලදී. • දේශගුණ විපර්යාස පිළිබඳ මෙන්ම ඒ සඳහා අනුගත වන අයුරු පිළිබඳ රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2 පැවැත්වූ අතර අපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සංවිධානය කරන ලද රජයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් සඳහා සම්පත් දායකත්වය දක්වන ලදී. • දේශගුණ විපර්යාස පිළිබඳ දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන විශ්ව විද්‍යාල සිසුන් දැනුවත් කිරීම් ද සිදුකරන ලදී.

දේශීය ඉලක්ක	අරමුණ කරා ලඟා වීම සඳහා හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව)
	• දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ලද සිසුන් සහ අනෙකුත් ආයතන දැනුවත් කිරීම් සිදු කරන ලදී
13.3.b	13.3. b
කාලගුණය, දේශගුණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ නිලධාරීන්ගේ ධාරිතාව වැඩි දියුණු කිරීම.	• විදේශීය පුහුණු අවස්තා ලැබෙන පරිදි කාලගුණ විද්‍යාඥයින් සඳහා අවස්ථා ලබා දී ඇත.
13.3.c	13.3.c
උපද්‍රවයන් හඳුනා ගැනීම.	සිදු කර නොමැත.
13.3. d	13.3. d
උපද්‍රව සිතියම්ගත කිරීම	• උපද්‍රව සිතියම්ගත කිරීම සඳහා ආපදා කළමනාකරණ ඔධ්‍යාස්තානයට අවශ්‍ය සහාය ලබා දෙයි.
13.B අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින් වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්, තරුණයින් සහ දේශීය හා ආන්තීකරණයට ලක්වූ ප්‍රජාවන් ද ඉලක්ක කරගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායී සැලසුම් සකස් කිරීමට හා කළමනාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩිදියුණු කිරීමේ යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම.	
13.B.a	13.B. a
ජාතික අනුගතවීමේ සැලැස්ම සකස් කිරීමට සම්බන්ධ වීම	• පරිසර අමාත්‍යාංශය සමග ජාතික අනුගතවීමේ සැලැස්ම සකස් කිරීමට සම්බන්ධ විය.
13.B.b	13.B. b
ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් සැකසීමට සම්බන්ධ වීම.	• පරිසර අමාත්‍යාංශය සමග ජාතික වශයෙන් නිර්ණය කර ඇති දායකත්වයන් - loss and damage සැකසීමට සම්බන්ධ විය.
13.B.c	13.B.c

දේශීය ඉලක්ක	අරමුණ කරා ලඟා වීම සඳහා හඳුනාගත් ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා 2023 වර්ෂයට අදාලව ගෙන ඇති ක්‍රියාකාරකම් හා ඒවායේ ප්‍රගතිය (එක් එක් ඉලක්කයට වෙන් වෙන්ව)
විවිධ තත්වයන් යටතේ අනාගත දේශගුණික විපර්යාස ප්‍රක්ෂේපණ සකස් කිරීම සංවර්ධනය කිරීම	• IPCC මගින් නිකුත් කරන ලද සය වන ඇගයීම් වාර්තාවට අනුව අනාගත දේශගුණ පුරෝකතන පිලියෙල කිරීමේ ජාතික දේශගුණ අනුගතවීමේ සැලැස්මට සමගාමීව කටයුතු IWMI සහ පරිසර අමාත්‍යාංශය සමග එක්ව ආරම්භ කරන ලදී.

5.2.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග

මෙම ඉලක්ක කරා යාමේදී වඩා විශ්වාසදායක කාලගුණ සහ දේශගුණ අනාවැකි සහ තොරතුරු සැපයීම අත්‍යවශ්‍ය කාරණයකි. මේ සඳහා සමකය ආසන්න කුඩා දිවයිනක් මෙන්ම නැගෙනහිරින් විසල් ඉන්දියන් සාගරය සේම බටහිරින් අරාබි මුහුදින් වටවී ඇති ශ්‍රී ලංකාවේ කාලගුණ සහ දේශගුණ අනාවැකි කීමම අභියෝගයකි.

එලෙසම අදාල සුදුසුකම් සහිත ප්‍රමාණවත් තරම් මානව සම්පත් හිඟයක් පැවතීම අනෙක් ප්‍රධාන අභියෝගය වේ. අවශ්‍ය තාක්ෂණික දැනුම විශේෂයෙන්ම ගණිතමය අනාවැකිකරණය වැඩිදියුණු කිරීම, නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබාදීම සහ අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් තරමේ කාලගුණ දත්ත ලබා ගැනීමේ ජාලයක් සහ යථාවත් වූ සුපිරි පරිසණක පහසුකම් නොමැති වීමද අභියෝගයකි. ශ්‍රී ලංකාව ට ගැලපෙන නිරවද්‍යතාවයෙන් ඉහල ගණිතමය ආකෘතින් හදුනා ගැනීමද පවතින තාක්ෂනය හා මානව සම්පත් හිගය හමුවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මුහුණ දෙන ගැටලුවකි.

6. පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමණාකරණය (2023.12.31 දිනට කාර්ය මණ්ඩලය)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	56	40	16
තෘතියික	30	08	22
ද්විතියික	237	179	58
ප්‍රාථමික	139	122	17

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එහි ප්‍රමුඛතම රාජකාරියවන කාලගුණ අනාවකිකරණය හා බැදුණු එදිනෙදා අනිවාර්යයෙන්ම සිදුකල යුතු රාජකාරීන් සඳහා ප්‍රමුඛතාවය දී කටයුතු කරයි, නමුත් මානව සම්පත් හිඟය නිසා එදිනෙදා සම්පූර්ණ කර තිබීම අනිවාර්ය නොවන කටයුතු මගහැරී යාම නොවැළැක්විය හැක. මේ හේතුවෙන් මානව සම්පත් හිඟය දැඩි ලෙස ආයතනයේ කාර්යසාධනයට බලපා ඇත.

ඇතිවෙමින් පවත්නා දේශගුණ වෙනස් වීම් හේතුවෙන් කාලගුණ සහ දේශගුණ තොරතුරු පිළිබඳ ඉමහත් ඉල්ලුමක් ඇතිවෙමින් පවතී. කෘෂිකාර්මික සහ ජල කළමණා කරණ කටයුතු සඳහා මෙන්ම සංවර්ධන, සංචාරක, බලශක්ති, ප්‍රවාහන, ගුවන්, නාවික කටයුතු සේම සෞඛ්‍ය වැනි සේවාවන් සඳහා ද අවශ්‍ය මෙම තොරතුරු සේවාදායකයට අවශ්‍ය ආකාරයෙන් සැපයීම සඳහා කාර්යමන්ඩලය ප්‍රමාණවත් නොවීමත් ඒ සඳහා නව තාක්ෂනය යොදා නොගැනීමත් ආයතනයේ කාර්යසාධනයට සෘජුවම බලපෑම් කරයි.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
මූලික විමර්ශන පුහුණුව	02	02	19	-	දේශීය	විමර්ශන පුහුණුව
පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම	03	02	28.5	-	දේශීය	ආයතන අංශයේ රාජකාරි විධිමත්ව පවත්වා ගැනීම
ප්‍රවාහන කළමණාකරණය	01	01	5	-	දේශීය	ප්‍රවාහන කළමණාකරණය
කාර්යාල කළමනාකරණය හා ආචාර ධර්ම	02	02	15	-	දේශීය	කාර්යාල කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම
Leadership & Team Building	05	01	-	-	දේශීය	මානව සම්පත් සංවර්ධනය
Effective Supervision "Key Link to Productivity, Quality and Safety Improvement"	11	01	107.25	-	දේශීය	
ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහන	02	01	-	-	දේශීය	ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව පවත්වා ගැනීම
සයිබර් ආරක්ෂණ ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන	01	01	-	-	දේශීය	සයිබර් ආරක්ෂණ ධාරිතා ප්‍රවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	10	40	-	දේශීය	ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව පවත්වා ගැනීම
Capacity Development Program on Anticipatory Action for Government Stakeholders	02	02	-	-	දේශීය	මානව සම්පත් සංවර්ධනය
විද්‍යුත් ප්‍රසම්පාදනය (e-GP) සම්බන්ධ පුහුණු වැඩසටහන	03	01	-	-	දේශීය	
Australia Awards Regional Short Course on Integrating Climate Change Adaptation and Disaster Risk Management to reduce vulnerability	01	12		**	විදේශීය (ඔස්ට්‍රේලියාව)	නිරන්තරයෙන් යාවත්කාලීන වන දේශගුණ විද්‍යාව පිළිබඳ දැනුම
Training on Seasonal Forecasting and Agro Meteorology	01	07		**	විදේශීය (ඉන්දියාව)	සෘතුමය අනාවැකි සහ කෘෂි කාලගුණ විද්‍යාව පිළිබඳ දැනුම

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
Fourth Leadership and Management Program for Senior Management of National Meteorological and Hydrological Services (NMHs)	01	05		**	විදේශීය (සිංගප්පූරුව)	නිරන්තරයෙන් යාවත්කාලීන වන දේශගුණ විද්‍යාව පිළිබඳ දැනුම
Training on Mid-Level Impact-based Forecasting (IBF) for Disaster Risk Reduction and Agriculture Sector under the South Asia Hydro-met Forum (SAHF)	02	05		**	විදේශීය (තායිලන්තය)	ආපදා අවදානම් අවම කිරීම සහ කෘෂිකර්ම අංශය සඳහා මධ්‍යම මට්ටමේ බලපෑම් මත පදනම් වූ පුරෝකථනය පිළිබඳ දැනුම
Flash Flood Guidance System (FFGS) Female Technical Empowerment Workshop	01	03		**	විදේශීය (ස්විට්සර්ලන්තය)	
Training on Seasonal Forecasting and Agrometeorology	01	05		**	විදේශීය (ඉන්දියාව)	සෘතුමය අනාවැකි සහ කෘෂි කාලගුණ විද්‍යාව පිළිබඳ දැනුම

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
Hydro-met and Early Warning Joint Learning Exercise II	02	09		**	විදේශීය (ඉන්දියාව)	නිරන්තරයෙන් අලුත් වන කාලගුණ හා දේශගුණ විද්‍යාව පිළිබඳ දැනුම යාවත්කාලීන වීම
Steering Committee Meeting, Joint Refresher and Step 5 training, of South Asia Flash Flood Guidance System (SAsiaFFGS) Black Sea and Middle East (BSMEFFGS) and South East Europe Flash Flood Guidance System (SEEFFGS)	02	03		**	විදේශීය (ඉන්දියාව)	නිරන්තරයෙන් අලුත් වන කාලගුණ හා දේශගුණ විද්‍යාව පිළිබඳ දැනුම යාවත්කාලීන වීම
Training on MSSG Rainfall Prediction Simulation	01	04		**	විදේශීය (ජපානය)	කාලගුණ විද්‍යා පුරෝකතනයන්
Training on Agrometeorology	02	05		**	විදේශීය (ඉන්දියාව)	කෘෂි කාලගුණ පුරෝකථන සැපයීම පිළිබඳ දැනුම
WMO RA II Technical Workshop on Marine and Coastal Services	01	04		**	විදේශීය (ජපානය)	සමුද්‍ර කාලගුණ විද්‍යාව පිළිබඳ දැනුම

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (දින)	සමස්ත ආයෝජනය (රු.'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
Basic Impact-based Forecasting Training	02	05		**	විදේශීය (බංගලාදේශය)	බලපෑම් මත පදනම් වූ කාලගුණ විද්‍යා පුරෝකථන
Weather Forecasting and Climate Prediction	01	04		**	විදේශීය (තායිලන්තය)	කාලගුණ අනාවැකි සහ දේශගුණ අනාවැකි
Training on Seasonal Prediction to Operational Services in South Asia	01	05		**	විදේශීය (ඉන්දියාව)	දේශගුණ අනාවැකි
WMO Integrated Global Observing System (WIGOS) Implementation Workshop for the WMO Region Association II (RA-II) Members	01	04		**	විදේශීය (චීනය)	කාලගුණ විද්‍යා දත්ත පද්ධතිය යාවත්කාලීන
Workshop and Meeting on Weather Radar (Japan Meteorological Agency)	01	07		**	විදේශීය (ජපානය)	ඩොප්ලර් රේඩාර් තාක්ෂණය

**විදේශ පුහුණු සඳහා වන වියදම් පිළිබඳව පුහුණු ලබා දෙන ආයතන විසින් දැනුම් දීමක් නොකෙරේ.

*ලෝකයේ නිරන්තරයෙන්ම යාවත්කාලීන වන කාලගුණ සහ දේශගුණ විද්‍යාව පිළිබඳ කරුණු වලින් දෙපාර්තමේන්තුවේ මානව සම්පත සන්නද්ධ කිරීම හා එකී මානව සම්පත වඩාත් කාර්යක්ෂමව තබා

ගැනීම සඳහා පසුබිම සැකසීම සඳහා අවශ්‍ය මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ප්‍රධාන ලෙස දායක වේ.

දිවයින තුළ මෙන්ම දිවයින වටා වන මුහුදු ප්‍රදේශ ආශ්‍රිත කාලගුණික තත්ත්වයන් පිළිබඳව පැය 24 පුරාම ක්‍රියාත්මක වන පරිදි අනාවැකි පළ කිරීම, අවශ්‍ය අවස්ථාවන්වලදී අවවාදාත්මක අනාවැකි මෙන්ම අනතුරු ඇඟවීම් සිදු කිරීම, සුනාමි පිළිබඳ නිවේදන අදාල අවස්ථාවන්හිදී සිදු කිරීම මෙන්ම බලශක්ති ක්ෂේත්‍රයේ තීරණ ගැනීමේ කටයුතු සඳහාද අවශ්‍ය කාලගුණික අනාවැකි ගුණාත්මකව හා නිරවද්‍යව සැපයීම ප්‍රධාන් අරමුණ කරගනිමින්

- ඩොප්ලර් රේඩාර් තාක්ෂණය සුහුරු ලෙස භාවිතා කල හැකි හා නඩත්තු කල හැකි විම,
- වඩා විධිමත් ලෙස දේශගුණ විද්‍යාව පිළිබඳ අධ්‍යයනයන් මගින් සෘතුමය සහ දිගුකාලීන අනාවැකි රාජ්‍ය සහ රාජ්‍ය නොවන පාර්ශ්වකරුවන් සඳහා ඵලදායි ආකාරයෙන් ඉදිරිපත් කිරීම,
- සංඛ්‍යාත්මක කාලගුණ පුරෝකතන වඩාත් නිරවද්‍යව (high resolution) සැපයීම මගින් කෙටිකාලීන, මධ්‍යකාලීන කාලගුණ විද්‍යා පුරෝකතනයන්, කෘෂිකර්ම අංශය, ධීවර හා නාවුක කටයුතු සඳහා, ගුවන්කාලගුණ කටයුතු සඳහා අවශ්‍ය පුරෝකතනයන් නිර්මාණයන් සිදුකිරීම,
- කෘෂිකර්මාන්තය නගා සිටුවිම සඳහා දායකත්වය සපයන සියලුම ආයතනයන්හි අවශ්‍යතාවන්ට ගැලපෙන සේ යාවත්කාලීන කරන ලද කෘෂි කාලගුණ පුරෝකථන සැපයීම,
- සම්ප්‍රදායික උපකරණ, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කාලගුණ විද්‍යා උපකරණ, පරිගණක ජාල, වන්ද්‍රිකා ග්‍රාහක පද්ධති ආදී පද්ධති අලුත්වැඩියාව සහ නිසි පරිදි නඩත්තු කොට පවත්වාගෙන යාම,
- කාලගුණ විද්‍යා දත්ත පද්ධතිය යාවත්කාලීන කර තත්ත්වපාලනය හා සංරක්ෂණය කරන ලද දත්ත පර්යේෂණ හා අධ්‍යයන කටයුතු සඳහා වඩා ගුණාත්මකව සැපයීම,

යන දෙපාර්තමේන්තුවේ ඉහත අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි අදාළ මානව සම්පත සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් දායක කර ගනු ලැබේ.

7. පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

7.1. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1. **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**				
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	**අනුකූල වේ**		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	**අනුකූල වේ**		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	-		
2. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)				
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		
2.3	විගණන විමසුම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	**අනුකූල වේ**		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛණය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3. මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභීනියෝජනය කිරීම (මු.රෙ.135)				
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුම්වත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4. වාර්ෂික සැලසුම් සකස් කිරීම				
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5. විගණන විමසුම්				
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, විගණන විමසුම වලට පිළිතුරු ලබාදීම	අනුකූල වේ		
6. අභ්‍යන්තර විගණනය				
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7. විගණන හා කළමනාකරණ කමිටු				
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබීම	මේ වන විට වැඩබලන අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර ඇත.
8. වත්කම් කළමනාකරණය				
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දි ගැනම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9. වාහන කළමනාකරණය				
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශය වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	වාහන ලෝග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	වියදම් කළමනාකරණ හේතු හා ඉන්ධන සිමා පැවතීම	2024 වර්ෂයේ ඉන්ධන දහන පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.
9.6	කල් බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලෝග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය				
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11. ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්				
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.3	වර්ෂකට වැඩ කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරිවුල් කර තිබීම	අනුකූල නොවේ	අදාළ කටයුතු සඳහා නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත	නීතිපති උපදෙස් අනුව වහාම ක්‍රියාත්මක වීම
13. පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 පුකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	2024.02.28 දිනට පිළියෙළ කර අවසන් කිරීමට නොහැකි විය	2024.04.30 දින වන විට අවසන් කර ඉදිරිපත් කර ඇත.
14. අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15. ආදායම් ගිණුම				
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16. මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ		අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල තවදුරටත් පවතින පුරප්පාඩු පිලිබඳව දන්වා ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකාවන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16.3	20.09.2017 දිනැති MSD චක්‍රෙල්ඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම				
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සපයා දී තිබීම	අනුකූල නොවේ	වෙබ් අඩවියේ නිර්මාණකරු වෙත ඒ සඳහා විටින් විට ඉල්ලීම් කර ඇති නමුත් අවශ්‍යතාවය ඉටු කිරීමට අපොහොසත් වීම	අවශ්‍යතා සපුරා ගැනීමට නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	2023 වර්ෂය සඳහා චක්‍රලේඛය ට අදාලව සහස් කර නොතිබිණි	2024 සඳහා අදාළ චක්‍රලේඛයට අනුව සකස් කිරීමට නියමිතය. ආරම්භක පියවර ගෙන ඇත.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂනය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කිරීම	අනුකූල වේ		
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	2023 වර්ෂය සඳහා ආකෘතියට අදාලව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සහස් කර නොතිබිණි	2024 සඳහා අදාළ ආකෘතියට අනුව සකස් කරනු ලැබේ.

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	අදාල ආකෘතියට අනුව නොවුවත් දෙපාර්තමේන්තු වේ දීර්ගකාලීනව සිදුකර ගෙන යන ක්‍රමවේදය තුල සැලසුම් කර ඇත.	2024 වසර සඳහා අදාළ ආකෘතියට අනුව සැලසුම් කර ඇත.
19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල නොවේ	රා.පරි චක්‍ර ලේඛ 02/2018(1)අනුව අවශ්‍ය නොවන බව දක්වා ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	පද්ධතිවල මිල ඉහලයාම, රජයේ අරමුදල් ලබා ගැනීමේ දුෂ්කරතා, වියදම් පාලන වක්‍ර ලේඛ මත කටයුතු කිරීම ආදී හේතු මත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.	ඉදිරියේදී අනුමත වන්නා වූ ප්‍රතිපාදන සීමා මත ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

ඇමුණුම

இணைப்பு

Annexure

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑමජී/ඒ/එම්ඊවී/02/2023/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 07 දින

ගණන්දීමේ නිලධාරී

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 304- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 07 දින නිකුත් කර ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණනය සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපිවන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. අත්තිකාරම් ගෙවීම්

නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 94,830ක ආපදා ණය සහ රු. 27,000 ක වාහන ණය 2010 ජූලි 08 දින සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.2 අග්‍රිම ශේෂය

ආයතනය වෙත සමාලෝචිත වර්ෂයේ ලැබුණු අග්‍රිමයෙන් රු.631,439ක මුදලක් ප්‍රසම්පාදන කටයුතු ඇතුළු කාර්යයන් සැලසුම් කර පරිදි සිදු කිරීමට නොහැකි වීමෙන් 2023 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයට හරවා යැවීමට සිදු වී තිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොකිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
ඇප තැන්පත් ලේඛනය	මුදල් රෙගුලාසි 891	විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 30ක මුළු ප්‍රතිපාදනයද, තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් සියයට 26 සිට 99.5 දක්වා පරාසයක රු. මිලියන 38.37ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි.

(ආ) මු.රෙ.66/69 මාරු කිරීම් මගින් වැය විෂයන් 04 කට අදාල මූලික ප්‍රතිපාදනයෙන් සියයට 70 සිට සියයට 400 දක්වා පරාසයක් තුල වැඩිකර ගැනීමක් හෝ අඩුකර ගැනීමක් හෝ සිදුකර තිබීමෙන්ද, තවත් වැය විෂයන් 3ක මූලික ප්‍රතිපාදනයෙන් පරිපුරක ඇස්තමේන්තු මගින් සියයට 67 සිට සියයට 153 දක්වා පරාසයක වැඩි කර තිබීමෙන්ද අයවැය ඇස්තමේන්තු තාත්වික පදනමකින් හා නිසි පුරෝකථනයකින් තොරව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීතිරීති / විධානයට යොමුව	අනුකූල නොවීම
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත 16(2)උපවගන්තිය	මූල්‍ය ප්‍රකාශ සමග ඉදිරිපත් කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XV පරිච්ඡේදයේ 10.4 සහ 10.10 වගන්තිය	අනුග්‍රාහක විදේශ ආයතනයකින් ප්‍රදානය කරන අධ්‍යනයක් පුහුණු පාඨමාලාවක්, ශිෂ්‍යත්වයක්, සම්මන්ත්‍රණයක් හෝ වැඩමුළුවක් වැනි කරුණක් සඳහා විදේශ ගමනක් සම්බන්ධයෙන් 16 වැනි පරිශිෂ්ඨය පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්‍රවල අතිරේක පිටපතක් සහ නිලධාරියාගේ විදේශ නිවාඩු අනුමත කිරීමේ ලිපියේ පිටපතක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ විදේශ ගමන් 11ක් සම්බන්ධයෙන් ඉහත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 565 (5)	එක් එක් මාසය සඳහා පොදු 71 ආකෘති පත්‍රයේ පිළියෙල කල මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊලඟ මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ii)	මුදල් රෙගුලාසි 570,571,571(3)	අවුරුදු 02 ඉක්මවූ තැන්පතු එකතුව රු.348,933 ක් අවස්ථාවෝචිත පරිදි අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබූ අතර ඉකුත් තැන්පත් පිළිබඳව සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ලැයිස්තු පිළියෙල කර නොතිබුණි.
(ඇ)	2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අංක 05/2008- 1.4 XVIII වගන්තිය	ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තිය සකස් කර තිබුණද ප්‍රඥප්තිය පිළියෙල කරන අවස්ථාවේදී ඉටු කල යුතු අවශ්‍යතා වන කාර්යාල පරිශ්‍රය තුල හා නිල වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය කිරීම හෝ අඩුම තරමින් මාස 06කට වරක් සමාලෝචනය කිරීමක් හෝ සිදුකර නොතිබුණි.
(ඉ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	දෙපාර්තමේන්තුවේ ධාවනය කරන වාහන 03 ක් සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.
(ඊ)	2019 අප්‍රේල් 19 දිනැති අංක 3/2017, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2001 අගෝස්තු 07 දිනැති 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	වේලාව පදනම් කරගෙන අතිකාල හා නිවාඩු දින වැටුප් ආදි නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් මගින් සනාථ කල යුතු වුවත්, ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන්ගේ පැමිණීම් හා පිටවීම් ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කිරීමකින් තොරව 2023 වර්ෂයට අදාළව 1/20 දීමනාව හා අතිකාල ගෙවීම් වශයෙන් රු. 24,941,323ක මුදලක් ගෙවීම් කර තිබූ බව නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යයභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට 2023 ජූනි 15 දින ඉදිරිපත් කර තිබුණු අතර එය සංශෝධිත අයවැය ප්‍රතිපාදනවලට අනුගතව සකසා ඉදිරිපත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්ම අනුව මුළු ප්‍රතිපාදන රු. මිලියන 493.1ක් වූ අතර සංශෝධිත අයවැය අනුව ප්‍රතිපාදනය රු. මිලියන 515.1ක් විය.

(ආ). ආයතනයේ 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මේ ඇතුළත් Under CRESMPA Modernization Project යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒ සම්බන්ධ තොරතුරු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

ප්‍රසම්පාදන කාර්යයන් 06 ක් සඳහා වෙන් කරන ලද රු. මිලියන 15.6 ක මුදලක් පිරිවිතර ලබාගැනීමට නොහැකි වීමෙන් අවලංගු කර තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජපන් ආධාර යටතේ (JICA) 2008 වර්ෂයේදී ලැබුණ රු.මිලියන 570 වටිනා ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38න් 35ක් මගින් උෂ්ණත්වය, ආර්ද්‍රතාවය,වර්ෂාපතනය, සුළඟේ වේගය හා දිශාව, පීඩනය, සූර්ය විකිරණ ප්‍රමාණය යන පරාමිතීන් මනිනු ලබන අතර ඉතිරි පද්ධති 03 විගණිත දිනය වූ 2023 මැයි 31 දින වනවිටත් කටුනායක ගුවන්තොටුපල, ත්‍රිකුණාමලය, මාලිබොඩ යන ස්ථානවල සවිකිරීමට කටයුතු කර නොතිබුණි.එබැවින් අධික වටිනාකමක් සහිත උපකරණ උෆණ උපයෝජිතව පැවතීමට ඉඩහැරීම හේතුවෙන් අවශ්‍ය පහසුකම් ලබාගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.

(ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ පද්ධති 35න් 14ක පමණක් GPRS තාක්ෂණය යටතේ නියමිත පරිදි දත්ත ආයතනයට ලැබෙන අතර මධ්‍යස්ථාන 10ක බැටරිවල ආයුකාලය අවසන් වීම නිසා අක්‍රීයව පැවතුණි. හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හිදී ස්වයංක්‍රීය දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත් වන අතර මේ අනුව පද්ධති ස්ථාපිත කිරීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මාපක 453ක් විසිරී පවතින අතර ඒවායේ වර්තමාන ක්‍රියාකාරීත්වය හා දත්ත ලැබීම් අනුව සාම්ප්‍රදායික වැසි මාපක 44කින් පමණ දත්ත අඛණ්ඩව නොලැබේ.ඒවායේ නඩත්තු කටයුතුද සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඈ) දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන 122 ක් පවතින අතර 2023 මැයි 31 දිනට වර්ෂාමාන 70ක් පමණ ක්‍රියාත්මකව පැවතුණි. ඒ අනුව වර්ෂාමාන 52ක් පමණ අක්‍රීය වී තිබුණු අතර 2023 නොවැම්බර් 30 දිනට නඩත්තු කර තිබුණේ වර්ෂාමාන 36ක් පමණි.

(ඉ) දෙපාර්තමේන්තුව සතු පිරිවැය රු.1,985,000ක් වූ WP-PA 4026 දරන කැබ් රථය 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වර්ෂ 06 ක් පුරා අළුත්වැඩියාවක් සිදු කිරීමකින් තොරව ධාවනයෙන් ඉවත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රක්ෂණ ගාස්තු ලෙස රු.30,117ක මුදලක්ද ගෙවා තිබුණි.විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 23 දින වනවිටත් එම වාහනය භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාලගුණ විද්‍යා නිරීක්ෂක සන්නිවේදක නිලධාරීන් සඳහා කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණ අන්තර්ජාතික පුහුණු මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහනට සහභාගී වූ නිලධාරීන්ට අවශ්‍ය ආහාර, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් පරිදි සැපයීමට අදාල ආයතනය විසින් කටයුතු කර නොතිබීම හේතුවෙන් වැඩසටහන මගින් බලාපොරොත්තු වූ සේවක අභිප්‍රේරණය ඉටු වී නොතිබුණ අතර ඒ සඳහා දරන ලද රු.415,800ක වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

ඉහත හේතූන් මත මේ සඳහා පැවැත්වීමට සැලසුම් කර තිබූ දෙවන වැඩසටහන ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් සහභාගී නොවීමෙන් අවලංගු කිරීමටද සිදු වී තිබුණි.

3.5 **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීම සඳහා 2019 සිට 2022 වන විට රු. මිලියන 563.58 ක (2023 - රු. මිලියන 50.5) ප්‍රතිපාදන වෙන්කර තිබුණද, වියදම රු. මිලියන 0.462ක් පමණක් වී තිබුණි. ගිවිසුම්ගත වී වසර 05 ක් (2017-2021)ගත වී ඇතත් රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවිය යුතු වුවද, වර්තමානයේ මිල ගණන් ඉහළයාම නිසා ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. 2022 මැයි මාසයේදී JICA ආයතනය හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් රේඩාර් පද්ධති 02 ක් වෙනුවට එක් පද්ධතියක් පමණක් ස්ථාපිත කිරීමට එකඟතාවය පලකර ඇත.

මේ අනුව කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පැවතියද, වර්ෂ 15 කට ආසන්න කාලයක් එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දී තිබීමෙන් එහි නිරවද්‍යතාවයට වඩාත් ලංවීම හා විශ්වසනීයත්වයෙන් යුතුව පුරෝකථන හා අනාවැකි නිකුත් කිරීමට කටයුතු සැලසේද යන්න නිශ්චය කිරීමට නොහැකි විය.

(ආ). රේඩියෝසොන්ඩ් උපකරණය මඟින් ඉහළ සුළං නිරීක්ෂණය, වායු පීඩන උෂ්ණත්වය, ආර්ද්‍රතාව, සුළඟේ වේගය හා සුළඟේ දිශාව ඉහළ වායු නිරීක්ෂණ දත්ත ලබාගනු ලබයි.එසේ වුවද, නිසි සැලසුමකට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීමෙන් 2022 වර්ෂයේ යැවිය යුතු වාර 156න් 141 වාරයක් සහ 2023 වර්ෂයේ අගෝස්තු 31 දක්වා සිදුකල යුතු වාර 104න් 83 වාරයක් ඉහළ වායුගෝල නිරීක්ෂණ දත්ත ලබාගෙන නොතිබුණි.2022 වර්ෂයේ සිට රේඩියෝසොන්ඩ් නිරීක්ෂණය නොකල වාර සංඛ්‍යාව, ආසන්න වශයෙන් සිදුකල යුතු සංඛ්‍යාවෙන් සියයට 86ක් පමණ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ). පහළ මට්ටමේ සිට මධ්‍යම මට්ටම දක්වා සුළඟේ වේගය හා දිශාව මැනීම සඳහා නියමු බැලුන් නිරීක්ෂණ මධ්‍යස්ථාන 04ක දෙපාර්තමේන්තුවේ නියමිත ක්‍රියාවලිය පරිදි සෑම දිනකම වේලාවන් 03කදී නිරීක්ෂණය සිදුකල යුතු වුවද, ඒ සඳහා අවශ්‍ය නියමු බැලූන් 4000 (ආසන්න වශයෙන්) ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සැලසුම් සහගතව සිදු නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේ සිදු කල යුතු නිරීක්ෂණ වාර නියමිත පරිදි සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) රේඩියෝසොන්ඩ් හා නියමු බැලුන් පිරවීම සඳහා හයිඩ්‍රජන් වායුව යොදා ගන්නා අතර, කොළඹදී හයිඩ්‍රජන් වායුව නිපදවා ගැනීම සඳහා හයිඩ්‍රජන් ජෙනරේටරය යොදාගනු ලබයි. හයිඩ්‍රජන් නිෂ්පාදන ක්‍රියාවලිය ඉතා අනතුරුදායක වුවද, හයිඩ්‍රජන් නිෂ්පාදනයේදී හා බැලුම් යවන අවස්ථාවලදී එම නිලධාරීන් ආරක්ෂිත ඇඳුම්වලින් යුක්ත නොවීම, හයිඩ්‍රජන් නිෂ්පාදනාගාරය ආසන්නයේ ආයතනයේ වාහන ගාල් කිරීම සහ වාහන නිතර පනගැන්වීම සිදු කිරීම වැනි අ නාරක්ෂිත ක්‍රියාවන් සිදුවන බව කොළඹ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) ගුවන් ගමන් සඳහා අවශ්‍යවන කාලගුණික දත්ත සැපයීම අරමුණු කරගෙන රත්මලාන ගුවන්තොටුපල ආශ්‍රිතව පිහිටුවා තිබූ කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ කාලගුණ දත්ත ලබා ගැනීම, ඒවා සන්නිවේදනය සඳහා වූ උපකරණ නඩත්තුව ආදී කරුණු පිළිබඳව කරන ලද සෝදිසි පරීක්ෂාවේදී ලෝක කාලගුණ විද්‍යා සංගමයේ මාර්ගෝපදේශ අනුව උපකරණ කොටුව සකස් කර නොතිබීම, ක්ෂණික සුළං ප්‍රහාර, එහි වේගය හා දිශාව පරීක්ෂා කිරීමට පැවතිය යුතු Gust Recorder යන්ත්‍රය වසර ගණනාවක සිට ක්‍රියාවිරහිත තත්ත්වයේ පැවතීම, කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාලයට සම්ප්‍රේෂණය වන පරිගණක පද්ධතිය 2019 වර්ෂයේ සිට අක්‍රීයව පැවතීම, උපකරණ කොටුව තුළ උෂ්ණත්වමාන ගබඩාකර ඇති පෙට්ටිවල කණු (Stevenson Screen Stand) දිරාපත් වීම යන කරුණු නිරීක්ෂණය විය.

(ඊ) අනුරාධපුරය,මඩකලපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම,රත්නපුර,කුරුණෑගල, වව්නියාව, මුලතිව් යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

04. මානව සම්පත් කළමනාකරණය

2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 462 ක් වන අතර සත්‍ය සේවක සංඛ්‍යාව 349 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 113 කි. එයින් පුරප්පාඩු 16ක් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් , අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ තනතුරු 04ක් , කාලගුණ විද්‍යාඥ තනතුරු 08ක් හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු තනතුරු 02ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරුවල කාර්යයන් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට ඉමහත් දායකත්වයක් සපයන බැවින් එකී තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමට ක්‍රියා නොකිරීමෙන් ආයතනයේ කාර්යසාධනය, අරමුණු හා කාර්යයන් නිසි ලෙස පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට